වාර්ෂික වාර්තාව

2020

වාර්ෂික
මූල්‍ය ප්‍රකාශන

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

දැක්ම

“ගෝලීය සන්දර්භය තුළ අභිවර්ධනීය සමාජයක සංවර්ධනයෙහි ලා මානව කුසලතා සංවර්ධනයට ඉගෙනුම්, ඉගැන්වීම් සහ පර්යේෂණ දායකත්වයේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත් වීම”

IHRA
UNIVERSITY OF COLOMBO

මෙහෙවර

“මානව සම්පත සංවර්ධනයට, අති නවීන තාක්ෂණයන් සහ ක්‍රමවේද උපයෝග කොට ගනිමින් දක්ෂ මෙන්ම මනාව කැපවූ කාර්ය මණ්ඩලයක් හරහා නායකත්වයේ තරගකාරී සංවර්ධනය, ව්‍යවසායකත්වය, සහ විවේචනාත්මක චින්තන හැකියාවන් සමග උසස් සමාජ සදාචාර ප්‍රමිතීන් ඉලක්කකොට අනේකවිධ කළමනාකරණ, කළමනාකරණ-නොවන රැකියා නියුක්තිකයන් සහ ව්‍යවසායකයින් උදෙසා ජාතික වශයෙන් තරගකාරී සහ ජාත්‍යන්තරව පිළිගත් ඉගෙනුම්, පර්යේෂණ සහ සංවර්ධන අවස්ථා සම්පාදනය කිරීම”


වටිනාකම
05
අප සිදු කරන දැ පවරා දීම
මානව සම්පත් අභිවර්ධන ආයතනික ප්‍රජාවගේ සහ ඉන් පරිබාහිර ප්‍රජාවගේද සදාචාරාත්මක නිවැරැදි පැවැත්ම අප දිරිගන්වනු ලබන අතර දැනුම සහ තොරතුරු එක් රැස් කිරීමේ අසීමාන්තික අයිතිය උසස් අධ්‍යාපන ඉගෙනුම් සම්පාදන ආයතනයක් පවත්වා ගත යුතු රහස්‍යභාවය තහවුරු කරමින් පවත්වාගෙන යාම අපි අගය කරමු.
වටිනාකම
04
ප්‍රජාවගේ ජීව ගුණය
එකම අරමුණක් පෙරදැරි කොට ඒකීය අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් ඒකීය ප්‍රජාවක් ලෙස "මම" නොව "අප" යන ගුණය ගොඩ නැගීමට හේතු පාදක වන අභිලාෂයන්ගෙන් යුක්තවන්නා වූ මානව ප්‍රජාවක් බවට පත්වීමට කටයුතු කිරීම අපි අගය කරමු.
වටිනාකම
03
විවිධත්වය හා අන්තර්ගතය
අප විවිධත්වය අගය කරනවා පමණක් නොව, අපගේ ආයතනය සහ සමාජය විසින් විවිධත්වයන් ප්‍රතිලාභ ලබා ගැනීම සහතික කිරීම උදෙසා අපගේ සාරධර්ම, විශ්වාස, පසුතල, කුසලතා සහ කාර්ය දිගානතියෙහි වෙනස්කම් පිළිගෙන ප්‍රවර්ධනය කරන අන්තර්ග්‍රහණීය කාර්ය සංස්කෘතියක් අපි අගය කරමු.
වටිනාකම
02
අභිවර්ධනීය චින්තනය
එකිනෙකාගේ කාර්යභාරය උපරිම කැපවීමකින් සිදු කරමින් අපගේ සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵල සාධාරණාත්මකව බෙදා ගනිමින් සහ අප ළඟා කරගත් දේ මානව සම්පත් අභිවර්ධන ආයතනය තුළ හා ඉන් පිටත අනාගත පරපුරට තිරසාරව පවත්වා ගනිමින් සහ දියුණු කරමින් සමාජයේ අභිවර්ධනය සඳහා සාමූහිකව කටයුතු කිරීම අපි අගය කරමු.
වටිනාකම
01
අධ්‍යාපනයේ නිදහස
විධිමත් උසස් අධ්‍යාපන අධ්‍යයන අවස්ථා අහිමිව සේවයේ නියුක්තව සිටින කළමනාකාරී නොවන සේවා නියුක්තිකයින් උදෙසා නිදහස් අධ්‍යාපනය අඛණ්ඩව සම්පාදනය කරන අතරම, උසස් අධ්‍යාපනික අවස්ථා පූරණය කර ගැනීමට නොහැකිවූ කළමනාකාරී සේවා නියුක්තිකයන්, සහ වෘත්තිකයන් සංවර්ධනය කිරීම අපි අගය කරමු.

වැඩබලන අධ්‍යක්ෂවරියගේ සමාලෝචනය



සේවක අධ්‍යාපනයේ පුරෝගාමියෙකු වශයෙන්, ගෝලීය වසංගතය මෙන්ම 2015 සිට 2020 අගෝස්තු මස දක්වා ආයතනයේ සේවයේ නියුක්ත වූ අභාවප්‍රාප්ත මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතාගේ ශෝකජනක අහිමිවීම මධ්‍යයේ වුවද කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය 2020 වසර තවත් සාර්ථක කථාංගයක් ලෙස සනිටුහන් කර ඇත. මේ දුෂ්කර කාලයේදී ද, මානව සම්පත් අභිවර්ධන ආයතනය නව සාමාන්‍යකරණ තත්වය යටතේ පැනනැඟුණු අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙමින් නැවත වරක් ඉහළට නැඟි යනු දැකිය හැකි විය.

ඉමහත් සතුටකින් සහ ආඩම්බර හැඟීමකින් යුක්තව වැඩබලන අධ්‍යක්ෂවරිය වශයෙන්, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2020 වසර සඳහා වූ මෙම වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරන්නෙමි. කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීමත් සමගම, ක්‍රියාත්මක වූ අඟුළු දැමීම් සහ සංචරණ සීමා හේතුවෙන් ශ්‍රී ලංකාව ඇතුළුව ලොව පුරා මහත් නොසන්සුන්තාවයක් සහ කනස්සල්ලක් ඇති වියි නමුත් මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශක්තිජනක පීවගුණය අඩු කිරීමට එයට නොහැකි විය. ශ්‍රම කළමනාකරණවේදී උපාධිය නමින් නව උපාධි පාඨමාලාවක් හඳුන්වා දෙමින් මෙම දුෂ්කර කාලය ජයගැනීමට හැකිවිය. වෘත්තිය හිණිපෙත්තට ගමන් කිරීමට උත්සාහදරන්නා වූ වර්තමානයේ රැකියා නියුක්තිකයන්ට ශක්තිය ලබා දීමෙහි ලා එහි මූලික අවධානය යොමු වී ඇත. තුන් වසරක සාමාන්‍ය උපාධිය ලෙස ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 5 වන ස්ථරය සහ සිව් වසරක ගෞරව උපාධිය ලෙස ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 6 වන ස්ථරය සඳහා වන අනුමැතියන් සහිතව මෙම ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහන ආරම්භ කිරීමට හැකි වීම මානව සම්පත් අභිවර්ධන ආයතනය ලැබූ විශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැක. මෙම උපාධි වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවීම අගෝස්තු මස අවසානය දක්වා පැවති අතර ඒ සඳහා අපේක්ෂකයින් 1000කට ආසන්න සංඛ්‍යාවක් අයදුම් කිරීම තුළ මෙවැනි වැඩසටහනක් සඳහා වූ ඉල්ලුම මනාව දැකගත හැකි විය.

අඟුලු දැමීම් සහ සංචරණ සීමා කිරීම් යටතේ වුව ද, මාර්ගගත ඉගෙනුම් හා තක්සේරු කිරීමේ ක්‍රම තුළින් සිය සහතිකපත්‍ර, ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට මානව සම්පත් අභිවර්ධන ආයතනයට හැකි වූ අතර එමගින් පාඨමාලාවන් සඳහා ඇතුළත් වූ සිසුන්ට නියමිත වේලාවට සිය පාඨමාලාවන් අවසන් කිරීමට හැකි විය. කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් ඇති කළ ඍණාත්මක හා අහිතකර බලපෑම් මධ්‍යයේ වුව ද මෙම වැඩසටහන් සඳහා ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව තිරසාර මට්ටමක පැවතුණි. ඉගෙනීම් සහ ඉගැන්වීමේ ක්‍රමය ඍජු ඉගෙනුම් ක්‍රමයේ (onsite) සිට මාර්ගගත ක්‍රමය (online) වෙත ගෙනයන අතර, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සියලුම අධ්‍යයන වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය මගින් ද පෙර පරිදිම එකම ශක්තියෙන් හා උනන්දුවෙන් පවත්වාගෙන යාමට සමත් විය.

2020 වර්ෂයේදී, මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පිරිනමනු

ලබන සහතිකපත් පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් 1,083ක් ලියාපදිංචි වූ අතර ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා හැදෑරීම සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 220ක් විය. මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වූ විද්‍යාර්ථීන් සංඛ්‍යාව 163ක් වූ අතර පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් 06ක් වෙනුවෙන් ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 9 වන සහ 10 වන ස්ථර සඳහා වන අනුමැතිය ලබා ගන්නා ලදී.

අපි, මානව සම්පත් අභිවර්ධන ආයතනය සෑම විටම රටට සහ එහි ජනතාවගේ අධ්‍යාපන අවශ්‍යතාවය, විශේෂයෙන් ම උසස් අධ්‍යාපනයේ නව මං සොයා යෑමට උත්සාහ කරන්නා වූ අය වෙනුවෙන් සේවය කිරීමට උත්සාහ දැරුවෙමු. මුළු ලෝකය පුරා ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගතය වසර පුරා විනාශකාරී ලෙසින් බලපෑවද, ආයතනයේ යහපත් දියුණුව සහ සංවර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙන්ම එහි ඉතිහාසයේ ස්ථිරව සිටීමට මානව සම්පත් අභිවර්ධන ආයතන පවුලේ කැපවීම සහ අභිප්‍රේරණය මට උපකාරී විය. මානව සම්පත් අභිවර්ධන ආයතනය වෙනුවෙන් ඔබ සියලුදෙනාටම, ඔබේ සිහින බිඳ වැටුණු තැනින් අප හා එක්ව නැඟී සිට එම සිහින යථාර්ථයක් බවට පත් කර ගැනීමට පැමිණි එකතු වන ලෙස අපි ආරාධනා කරන්නෙමු.



කේ.පී. මාතොටආරච්චි
අධ්‍යක්ෂ වැ/බ
මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

පටුන

01 - 04

1. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය
1.1. මානව සම්පත් අභිවර්ධන ආයතනය ගැන කෙටියෙන්
1.2. 2020 වර්ෂය තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා
1.3. මා.ස.අ. ආයතනයේ කළමනාකාරිත්වය
1.4. මා.ස.අ. ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය (2020)
1.5. මා.ස.අ. ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව
1.5.1. මා.ස.අ. ආයතනයේ ශාස්ත්‍රීය කමිටු සාමාජිකන් (රැස්වීම් වාර 9ක් පවත්වා ඇත)
1.5.2. මා.ස.අ. ආයතනයේ අධ්‍යයන මණ්ඩලය ම!ගින් පවත්වන ලද රැස්වීම් වාර ගණන

05 - 07

2. 2020 වර්ෂය තුළ ලබා ගත් ජයග්‍රහණ සහ සංවර්ධන කාර්යයන්
2.1 සංවර්ධනය
2.2 ජයග්‍රහණ
2.2.1 අධ්‍යාපනික ජයග්‍රහණයන්
2.2.2 පරිපාලනමය ජයග්‍රහණ
2.2.3 භෞතික පහසුකම් ළඟා කර ගැනීම්
2.3 ශිෂ්‍ය කුසලතා සංවර්ධනය
2.4 මානව සම්පත් අභිවර්ධන ආයතන ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ විෂය බාහිර ක්‍රියාකාරකම් (සංවිධානය කළ සහ සහභාගි වූ)
2.5 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ආයතනික සමාජ වගකීම

08 - 17

3. 2020 වාර්ෂික සමාලෝචනය
3.1 අධ්‍යයන පාඨමාලා
3.1.1 පශ්චාත් උපාධි පාඨමාලා
3.1.2 ප්‍රථම උපාධි පාඨමාලාව
3.1.2.1 ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
3.1.3 විධායක ඩිප්ලෝමා පාඨමාලා
3.1.4 ඩිප්ලෝමා පාඨමාලා
3.1.5 සහතිකපත්‍ර පාඨමාලා
3.2 2019 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු
3.2.1 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්
3.3 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර
3.4 අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු සේවා කාණ්ඩය
3.5 පුස්තකාලය

18 - 31

2020 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන
1. ආයතනික තොරතුරු
1.1 වාර්තා කිරීමේ ආයතනය - නීත්‍ය හා නෛතික ආකෘතිය
1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය
1.3 මූල්‍ය කාලපරිච්ඡේදය
2. පිළියෙල කිරීමේ පදනම
2.1 පිළියෙල කිරීමේ පදනම
2.2 ඉදිරිපත් කිරීම සහ කෘත්‍යාත්මක මුදල්
2.3 අනුකූලතා ප්‍රකාශය
2.4 මූල්‍ය ප්‍රකාශන ස!දහා වගකීම
2.5 ප්‍රවර්තන ව්‍යාපාර
2.6 වාර්තාකරණ දිනයට පසු සිද්ධි
2.7 සංසන්දනාත්මක සංඛ්‍යා
2.8 ද්‍රව්‍යමයභාවය හා එකතුව
2.9 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි සාරාංශය
3.1 බදු
අ. ආදායම් බද්ද
ආ. උපයන විට ගෙවීමේ බද්ද
ඇ. ජාතිය ගොඩනැගීමේ බද්ද
3.2 ස්ථාවර වත්කම්
3.3 කෙටි කාලීන ආයෝජනයන්
3.4 තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ වත්කම්
3.5 වෙළඳාම් හා අනෙකුත් අයවිය යුතු
3.6 පාරිතෝෂිකය
3.7 විශ්වවිද්‍යාල අර්ථසාදක අරමුදල හා සේවක භාරකාර අරමුදල
3.8 වියදම් හ!දුනාගැනීම
3.9 ජංගම වගකීම්
3.10 ණය හිමියන් සහ සහතික කළ වියදම්
3.11 අවිනිශ්චිත වගකීම්
3.12 ප්‍රාග්ධන ප්‍රදාන
3.13 පුනරාවර්තන ප්‍රදාන
3.14 සීමාකරන ලද අරමුදල්
3.15 ආදායම් හ!දුනා ගැනීම
3.16 මුදල් ප්‍රවාහ ප්‍රකාශ
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම/ශුද්ධ වත්කම්වල වෙනසක පිළිබඳ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ
මුදල් ප්‍රකාශ සඳහා සටහන
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III වන කොටසේ අංක 17 (ඇ) යටතේ දක්වා ඇති තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව - 2020
විගණකාධිපතිගේ වාර්තාව
2020 වර්ෂයට අදාළ විගණන වාර්තාව පිළිබඳ ආයතනයේ අදහස්

32 - 37

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය දශක හතරකට වඩා උරුමකම් කියන අතර එහි පූර්වක ආයතනය වූ සේවක අධ්‍යාපන ආයතනය 1979 අංක 11 දරන නියමාවලිය යටතේ 1975 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. 2006 වර්ෂයේ දී සේවක අධ්‍යාපන ආයතනය, මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලද අතර එය 2006 අංක 01 දරන නියමාවලිය මඟින් සංශෝධනය කරනු ලැබිණ. 2017 අගෝස්තු 22 දිනැති අංක 2033/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත නියමාවලිය මඟින් මානව සම්පත් අභිවර්ධන ආයතනයට උපාධි, ඩිප්ලෝමා, සහතිකපත් සහ අනෙකුත් අධ්‍යයන විශිෂ්ඨතා සහතික පිරිනැමීමට අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී. මානව සම්පත් අභිවර්ධන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයකි.

වසර හතරකට අධික ඉතිහාසය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය එහි පරිස්ථිතිය තුළ වෙනස්කම් සහ නව සංවර්ධනයන් රැසක් අත්දැක ඇති අතර පෞද්ගලික අංශයේ වර්ධනය, දැනුම් ආර්ථිකයේ නිර්ගමනය හා ශ්‍රම බලකායේ ගෝලීයකරණය මේ අතරින් සැලකිය යුතු කීපයකි. මෙම සංවර්ධනයන් වැළඳ ගැනීමට දරන ප්‍රයත්නයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය අඛණ්ඩව පරිණාමය වී ඇති අතර එහිදී එහි මුල් අභිමතාර්ථයක් වන සේවා කණ්ඩායම් සඳහා අධ්‍යාපනය ලබා දීමේ නව අර්ථයක් ගෙන ඇත. වර්තමානයේදී සේවා කණ්ඩායම් ලෙස කළමනාකරණ/ වෘත්තීමය සේවා කණ්ඩායම් අර්ථ ගන්වන අතර මානව සම්පත් අභිවර්ධන ආයතනය මෙම කළමනාකරණ/ වෘත්තීමය සේවා කණ්ඩායම් හි මානව කුසලතා සංවර්ධනය සඳහා කැප වී සිටියි.

කොළඹ විශ්වවිද්‍යාලයීය ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයට ලක් වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

මානව සම්පත් අභිවර්ධන ආයතනය මූලිකවම ආරම්භ කරන ලද්දේ සියලුම කාණ්ඩවල සේවකයන්ට ඔවුන්ගේ කුසලතා නායකත්ව ගුණාංග සහ ශ්‍රමිකයන් ලෙස ඔවුන්ගේ වගකීම් පිළිබඳ පිළිගන්නා ගුණාත්මකභාවයෙන් යුත් පෘථුල උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම සඳහා පහසුකම් සැලසීමටය. එමඟින් ඔවුන්ට තම සේවා ස්ථානයන්හි ඵලදායී දායකත්වයක් ලබා දීමට හැකිවන අතර 1983 වන තෙක්ම ප්‍රදානය කරන ලද්දේ ශාස්ත්‍රවේදී උපාධියක් වශයෙනි. කෙසේ වුවද 1986 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනැමීම ආරම්භ කරන ලද අතර 2007 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය සිය අධ්‍යයන ක්‍රියාකාරකම් ව්‍යාප්ත කරමින් ශාස්ත්‍රපති උපාධි පිරිනැමීම ද ආරම්භ කරන ලදී.

1.1. මානව සම්පත් අභිවර්ධන ආයතනය ගැන කෙටියෙන්

2020 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය ශාස්ත්‍රපති උපාධි විද්‍යාර්ථීන් 789ක් සහ ප්‍රථම උපාධිය හදාරන විද්‍යාර්ථීන් 579ක් ඇතුළුව සිසු සිසුවියන් 7,000කට ආසන්න සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දී ඇති මානව සම්පත් අභිවර්ධන ආයතනය, එය පිහිටුවා ඇති අරමුණ සැලකිල්ලට ගෙන ගතික අධ්‍යයන වැඩසටහන් පිරිනමනු ලබයි. වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය නව උපාධි වැඩසටහනකට විද්‍යාර්ථීන් ඇතුළත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගන්නා ලදී. එම පාඨමාලාවන් වන්නේ ශ්‍රම කළමනාකරණවේදී උපාධිය (සාමාන්‍ය) - තුන් අවුරුදු පාඨමාලාව හෝ/ සහ ශ්‍රම කළමනාකරණවේදී ගෞරව උපාධිය - සිව් අවුරුදු පාඨමාලාව පාඨමාලාව වශයෙනි. නව උපාධි පාඨමාලාව උසස් ගුණාත්මකභාවයෙන් යුත් රැකියා නියුක්ත උපාධි අපේක්ෂකයින්ට සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන්ම පාඨමාලාව හැදෑරීම ඉලක්ක කොට ඇති රට පුරා පැතිර ගිය කොවිඩ්-19 වසංගතය හේතුවෙන් නව උපාධි පාඨහාලාව සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම 2021 වර්ෂයේ දී ඇතුළත් කර ගැනීී අපගේ ප්‍රථම උපාධි වැඩසටහනේ වසර තුන තුළ ප්‍රධාන වශයෙන්ම වැඩකරන ප්‍රජාවට ඔවුන්ගේ වැඩ පරිසරයට ගැළපෙන පරිදි සිය කුසලතා, හැකියාවන් සහ නායකත්ව කුසලතා දියුණු කර ගැනීම ඉලක්ක කොට ඇත.

මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පිරිනමනු කරනු ලබන අධ්‍යයන වැඩසටහන් මෙසේයඃ පශ්චාත් උපාධි පාඨමාලා 04ක්, එක් උපාධි පාඨමාලාවක්, උසස්/ විධායක ඩිප්ලෝමා පාඨමාලා 03ක්, ඩිප්ලෝමා පාඨමාලා 04ක් සහ සහතිකපත්‍ර පාඨමාලා 08ක් වශයෙනි. මෙම පාඨමාලා 2018-2022 ආයතනික සැලැස්මට අනුකූලව පෙළගස්වා ඇත.

සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචිය - 2020



මූලාශ්‍රය - රැසි කළ දත්ත 2020, මා.ස.අ.ආ.

2020 වර්ෂය තුළ ඉහත දක්වා ඇති පරිදි සමස්ත සිසු සිසුවියන් 7,002ක් විවිධ අධ්‍යයන පාඨමාලා හදාරන ලදී.

1.2. 2020 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා



අභියෝගාත්මක ගෝලීය තත්වයන් හමුවේ මුහුණ දීමට මෙන්ම අපගේ ජාතික සංවර්ධනයේ මානව පදනම ශක්තිමත් පරිණත, බුද්ධිමත් දැනුම භාවිත කරන්නන් ලෙස මානව සම්පත අභිවර්ධනය කිරීමට සම්පූර්ණයෙන් කැප වූ විශිෂ්ට ආයතනයක් බවට පත් වීමට මානව සම්පත් අභිවර්ධන ආයතනය බලාපොරොත්තු වේ. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් උරුම වී ඇති ධනාත්මක ශාස්ත්‍රීය සම්ප්‍රදායන් සහ උසස් අධ්‍යයන ප්‍රමිතීන් තහවුරු කර ගනිමින් විශාල පරිවර්තනයකට බඳුන් වෙමින් පවතී. යහ පාලනයේ ප්‍රමිතීන් සපුරාලීම, ආයතන අධ්‍යයන වැඩසටහන් සඳහා දේශීය හා ගෝලීය ප්‍රතිනයන් ලබා ගැනීම සහ එමගින් සමාජීය වගකීමකින් යුත් ඉහළම ඉල්ලුමක් ඇති සේවක සන්නාමයක් සහිත රාජ්‍ය ආයතනයක් බවට පත් වීම මෙම පරිවර්තනයේ අරමුණ වේ.

1.3. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කළමනාකාරිත්වය

පූර්ණ කාලීන නිලධාරියෙකු ලෙස සේවය කරන ආයතනයේ පරිපාලනමය සහ අධ්‍යයන ප්‍රධානියා වන ආයතනයේ අධ්‍යක්ෂවරයා, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය මත කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ එකඟතාව සහිතව උප කුලපති විසින් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා ශාස්ත්‍රීය කමිටුවේ සභාපතිවරයා වන අතර අධ්‍යයන කමිටු සඳහා නිලබලයෙන් පත් වූ සාමාජිකයෙකුද වේ. ඔහු ආයතනයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා ද වන අතර ආයතනය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම දරන්නා ද වේ.

කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කළමනාකරණ හා සංවිධාන අධ්‍යයන අංශයට අනුයුක්තව සිටි දිවංගත මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා 2018 ජනවාරි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර තුනක කාලයක් සඳහා ආයතනයේ ස්ථිර අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කර ගැණිණ. කෙසේ වුවද, 2020 අගෝස්තු මස 28වන දින සිදුවූ එතුමන්ගේ හදිසි අභාවය හේතුවෙන් කේ.පී. මාතොටආරාච්චි මහත්මිය (කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) නව අධ්‍යක්ෂවරයෙකු පත්කරන තුරු මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂවරිය ලෙස පත් කරන ලදී.
ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත දක්වා ඇති

1.4. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය(2020)



මෙම නව ව්‍යුහය ආයතනයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවන පරිදි සකස් කොට ඇත.

1.5. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහයට අනුව එහි අධ්‍යයන මණ්ඩල හතර (04) ශාස්ත්‍රීය කමිටුවේ අනුමැතිය සහිතව පිහිටුවා ඇත. අධ්‍යයන විෂය ක්ෂේත්‍ර හා අදාළ ඒකක හත (07) අධ්‍යක්ෂවරයාගේ මාර්ගෝපදේශනය යටතේ පිහිටුවා ඇත.

1.5.1. ශාස්ත්‍රීය කමිටු සාමාජිකයන් (රැස්වීම් වාර 12ක් පවත්වා ඇත)

නම	පත් කරන ලද අධිකාරිය
මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා (2020 අගෝස්තු මස දක්වා)	සභාපති
කේ.පී. මානොටආරච්චි මිය (2020 අගෝස්තු මස සිට 2020 දෙසැම්බර් මස දක්වා)	සභාපතිනිය
මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම මහතා (2020 ජූනි මස දක්වා)	නිල බලයෙන් පත් වූ සාමාජික
මහාචාර්ය උපුල් සොන්නාදර මහතා (2020 ජූලි මස සිට)	නිල බලයෙන් පත් වූ සාමාජික
මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
ආචාර්ය කපිල බණ්ඩාර මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
මහාචාර්ය යූ.පී.ඒ. පුස්වේවල මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
මහාචාර්ය කේ.ඒ.පී. සිද්ධිසේන මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආචාර්ය එස්.ඒ.එම්.කේ. සමරකෝන් මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආචාර්ය ඩී.එම්.ඒ. දිසානායක මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
එච්.එම්.ඩබ්. හේරත් මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආචාර්ය දිනුකා විජේතුංග මිය	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ඩී.එස්. අමරසිංහ මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ප්‍රේමචන්ද්‍ර ඈපා මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
අයන්ති ද සිල්වා මහත්මිය *(2020 ජනවාරි මස සිට 2020 ජූනි දක්වා)*	මහා භාණ්ඩාගාර නියෝජිත
ජේ.ඒ.ටී.ඩී. සරත් කුමාර මහතා *(2020 ජූලි මස සිට)*	මහා භාණ්ඩාගාර නියෝජිත
මහාචාර්ය ඒ.ඒ. අසිස් මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත
ආචාර්ය එම්.ජී.ජී. හේමකුමාර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත
ආචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත
එච්.ඩී. ධර්මසේකර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත

1.5.2. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩල මගින් පවත්වන ලද රැස්වීම් වාර ගණන

අධ්‍යයන මණ්ඩලය	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ මණ්ඩලය	07
ප්‍රථම උපාධි පාඨමාලා අධ්‍යයන මණ්ඩලය	07
භාෂා ඉගෙනුම් වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය	06
ව්‍යාප්ති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය	08

ශාස්ත්‍රීය කමිටුවට සෘජුව වග කියනු ලබන කමිටු හය (06)කින් ආයතනික ව්‍යුහය සමන්විත වේ. එම කමිටුවල විස්තර පහත දක්වා ඇත.

කමිටුව	පවත්වන ලද රැස්වීම් සංඛාව
විගණන කමිටුව (ස්වාධීන කමිටුවකි.)	04
මූල්‍ය කමිටුව	07
පුස්තකාල කමිටුව	01
ප්‍රසම්පාදන කමිටුව	15
පුහුණු හා සංවර්ධන කමිටුව	02
පර්යේෂණ ප්‍රතිපාදන කමිටුව	02

1.6. කොවිඩ්-19 වසංගතය හමුවේ මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොවිඩ්-19 වසංගතය 2020 මාර්තු මස මැද භාගයේ සිට ආයතනයේ අධ්‍යයන කටයුතුවලට සැලකිය යුතු අන්දමින් බලපෑවේය. මාර්ගගත වේදිකාව භාවිත කරමින් අධ්‍යයන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට මානව සම්පත් අභිවර්ධන ආයතනය හැකි සෑම උත්සාහයක්ම ගත්තේය. අභියෝග මධ්‍යයේ වුවද, මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට නොමඳව සම්පත් සහ පහසුකම් සැපයීම සිදු කරන ලදී. එමෙන්ම, මානව සම්පත් අභිවර්ධන ආයතනය සිසුන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීමට සහ අවශ්‍යතා සපුරා ගන්නා තෙක් සහයෝගය ලබා දීමට ද මානව සම්පත් අභිවර්ධන ආයතනය සමත් විය.

තවද, වසංගතය පැතිරයාම වැඩි වීමත් සමග මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩලය සහ එහි සිසුන් ආරක්ෂා කර ගැනීම සඳහා ආයතන කළමනාකාරිත්වය බොහෝ උත්සාහයන් ගත්තේය. පෙර නොවූ විරූ අභියෝගයන් මධ්‍යයේ වුවද, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සංවිධානාත්මක මෙහෙවර සාක්ෂාත් කර ගැනීම කෙරෙහි මානව සම්පත් අභිවර්ධන ආයතනය සිය අවධානය යොමු කළේය.

“නිවසේ සිට වැඩ කිරීම” “work from Home” (WFH) යන සංකල්පය හඳුන්වා දෙන ලදී. කාර්ය මණ්ඩලය අතථ්‍ය (Virtual) හමුවීම් හරහා සම්බන්ධ වූ අතර එමගින් එහි සංවිධානාත්මක අරමුණු සාක්ෂාත් කර ගැනීමට මානව සම්පත් අභිවර්ධන ආයතනයට හැකි විය.

කෙසේවෙතත්, වසංගත තත්ත්වය ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර වැඩසටහන්වලට අහිතකර ලෙස බලපෑවේය. සමස්ථයක් ලෙස මාර්ගගත ඉගෙනුම් වේදිකාව ගැටලු මග හරවා ගැනීමට මාවත විවර කළේය.

2019 වර්ෂය තුළ සංවර්ධනය සහ ලබාගත් ජයග්‍රහණ

2.1. සංවර්ධනයන්

- දැනට පවතින 2006 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය ප්‍රතිස්ථාපනය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම.

- සේවක ප්‍රජාව සඳහා පුළුල් අවස්ථා සම්පාදනය කරමින් ශ්‍රම කළමනාකරණය විශේෂ කොට ගත් නව ප්‍රථම උපාධි වැඩසටහනක් හඳුන්වා දීමට කටයුතු කෙරිණ. ශ්‍රම කළමනාකරණවේදී උපාධිය - සාමාන්‍ය උපාධිය හෝ සිවි අවුරුදු ශ්‍රම කළමනාකරණවේදී ගෞරව උපාධිය වශයෙනි. වර්ෂය තුළ උපාධි අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබිය.

- ඉහළ මට්ටමේ සර්වරයක්, නවීන ෆයර්වෝල් පද්ධතියක් සහ අඛණ්ඩ බල සැපයුම් (UP) ඒකකයක් ස්ථාපනය කර ඇත.

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ නාමය ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) සහ ශ්‍රම කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ලෙස වෙනස් කිරීම සඳහා මූලික අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, විද්‍යාර්ථීන් සඳහා පුළුල් අවස්ථා විවෘත කරමින් විෂයමාලා වෙනස් කෙරෙනු ඇත.

- නවීකරණය කරන ලද අධ්‍යක්ෂ කාර්යාලය, රැස්වීම් ශාලාව සහ විභාග අංශය නැවත ස්ථානගත කරන ලදී.

- යෝජිත පරිදි පැරණි මූල්‍ය අංශය නවීන, අංග සම්පූර්ණ පහසුකම් සහිත දේශන ශාලාවක් බවට පරිවර්තනය කෙරිණ.

- නව විභාග අංශය, අධ්‍යක්ෂ කාර්යාලය, රැස්වීම් ශාලාව, නව සේවා ස්ථානය සහ කථිකාචාර්යවරුන්ගේ සියලුම කාමර දත්ත ජාල පහසුකම් සහිතව සම්බන්ධ කිරීමට මෙම වසර තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනයට හැකි විය.

2.2. ජයග්‍රහණයන්

2.2.1. අධ්‍යාපනික ජයග්‍රහණයන්

- කොළඹ විශ්වවිද්‍යාලයීය වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේදී විද්‍යාර්ථීන් උදෙසා විශිෂ්ට සම්මානය තුන (03)ක් පිරිනැමීමට කටයුතු ආරම්භ කරන ලදී මේවා රන් පදක්කම/ම් සමග මුදල් ත්‍යාග ලෙසින් ලබා දෙනු ඇත.

මෙම රන් පදක්කම් වන්නේ;

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය සහ ශ්‍රම කළමනාකරණවේදී ගෞරව උපාධි පාඨමාලාවන්හි සමස්ථ විශිෂ්ට කාර්ය සාධනය සඳහා වූ මහාචාර්ය ඔස්මන්ඩ් ජයරත්න සහ ආචාර්ය කුමාරි ජයවර්ධන රන් පදක්කම.
- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය තෙවන වසර සහ ශ්‍රම කළමනාකරණවේදී ගෞරව උපාධි පාඨමාලාවන්හි සිව්වන වසරේ සමස්ථ කාර්ය සාධනය සඳහා වූ මහාචාර්ය ඩබ්.එම්.කේ. විජේතුංග සහ චන්ද්‍රදාස මුණසිංහ මහතාගේ රන් පදක්කම.
- ශ්‍රම කළමනාකරණවේදී ගෞරව උපාධි පාඨමාලාවේ විශිෂ්ටතම පර්යේෂණ නිබන්ධය සඳහා වූ මහාචාර්ය පේ.ඒ.එස්.කේ. ජයකොඩි රන් පදක්කම වශයෙනි.

- ශ්‍රම අධ්‍යාපනවේදී ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය ආරම්භ කිරීම් මෙහි මුඛ්‍ය අරමුණ වන්නේ උපාධි අපේක්ෂකයින්ගේ ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් දිරි ගැන්වීම සහ ඔවුන්ට සහයෝගය දැක්වීමයි.

- සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා වැඩසටහනේ වඩාත් හොඳ සහයෝගිතාවක් වෙනුවෙන් ගල්කිස්ස මවුන්ට් ලැවිනියා හෝටලය සමග හවුල්කාරිත්වයක් ගොඩ නඟා ගැනීම වෙනුවෙන් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමේ වැඩ කටයුතු සිදු වෙමින් පවතී.

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන, සියලුම පශ්චාත් උපාධි වැඩසටහන්, විධායක/ උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා වැඩසටහන් මෙන්ම සහතිකපත් පාඨමාලාවන් යන සෑම වැඩසටහනකම අත්නර්ක්‍රියාකාරී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමයක් සාර්ථකව උපයෝජනය කෙරේ.

- අධ්‍යයන කටයුතු සඳහා සහතිකපත්පත් වැඩසටහන් හැර අනෙක් සියලුම අධ්‍යයන වැඩසටහන් ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) සාර්ථකව භාවිත කරයි.

- ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද මිශ්‍ර ඉගෙනුම්-ඉගැන්වීම් (BTL) ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී.

- විධායක/ උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා වැඩසටහන් සඳහා විෂයමාලා සමාලෝචනය කිරීමේ කටයුතු සාර්ථකව සිදුවෙමින් පවතී.

- පුස්තකාල තොරතුරු පද්ධතිය සහ ඊ-අවකාශ මෘදුකාංගය ස්ථාපනය කිරීම සිදු වෙමින් පවතී.

- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙක් දේශීයව පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කළ අතර, වර්ෂය තුළ එක් සාමාජිකයෙක් විදේශගතව පශ්චාත් උපාධිය සඳහා අධ්‍යයනය කටයුතු කරමින් සිටී.

2.2.1.2 වසර තුළ පවත්වන ලද වැඩමුළු සහ ජාලගත සම්මන්ත්‍රණ

- "තිරසාර සංවර්ධන ඉලක්ක - 2030 සඳහා අන්තර්-සංස්කෘතික හා බහු සංස්කෘතික බලපෑම" තේමාව කොට ගත් වැඩමුළුවක් මැලේසියාවේ මලයා

විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ AUA විද්වත් මහාචාර්ය විශාලච්චි බාලක්‍රිෂ්ණන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

- ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාවේ විද්‍යාර්ථීන් සඳහා කළමනාකරණ මූලධර්ම නමින් වැඩමුළුවක් පැවැත්වීම.
- සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාවේ සිසුන් සඳහා පවත්වන ලද වැඩමුළුවක දී සංචාරක ව්‍යාපාරයේ නෛතික පැතිකඩ පිළිබඳ සාකච්ඡාවක් පවත්වන ලදී.
- අවිනිශ්චිත යුගයක ඒදිනෙදා ජීවිතය නමින් ජාලගත සම්මන්ත්‍රණයක් පැවැත්විය.
- ආපදා කළමනාකරණ අධ්‍යයන වැඩසටහනේ විද්‍යාර්ථීන් විසින් කොවිඩ්-19 වසංගතය හමුවේ තිරසරව ජීවත් වීම නමින් ජාලගත සම්මන්ත්‍රණයක් පැවැත්විය.
- ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාවේ තෙවන වසර විද්‍යාර්ථීන් සඳහා සමාජ විද්‍යා සඳහා වූ සංඛ්‍යාන විද්‍යාත්මක පැකේජය (SPSS) පුහුණු වැඩමුළුව පැවැත්වීම.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය කළමනාකරණ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර පරිපාලනාධිපති උපාධි පාඨමාලාවේ විද්‍යාර්ථීන් සඳහා To tell or not: individual factors relate to whistleblowing intention කීමට හෝ නොකීමට whistleblowing intention සඳහා බලපාන කේවල සාධක මැයෙන් වැඩමුළුවක් පැවැත්වීම.
- ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාවේ තෙවන වසර විද්‍යාර්ථීන් සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මාර්ගගත වැඩමුළුවක් පැවැත්වීම.

2.2.2. පරිපාලනමය ජයග්‍රහණ

- වසංගත තත්ත්වය හේතුවෙන් මානව සම්පත් අභිවර්ධන ආයතන කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වීමට හැකි වූයේ එක් සෘජු වැඩමුළුවක් පමණකි. කෙසේවුවද වර්ෂය තුළ මාර්ගගත වැඩමුළු කිහිපයක් සිදු කරන ලදී. කාර්යයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ වෘත්තිමය දියුණුව මෙම මාර්ගගත වැඩමුළුවල අරමුණ විය.
- මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලය හා මාබඩලික හුවමාරු පුහුණු වැඩසටහනක් ආරම්භ කරන ලදී.
- මාර්ගගත ශීෂ්‍ය ලියාපදිංචි කිරීමේ ක්‍රමය සහ මුදල් ගෙවීමේ (payment gateway) පද්ධතිය මෙන්ම විද්‍යුත් ප්‍රතිචාර (e-response) පද්ධතිය දියත් කිරීම.
- පරිපාලන නිලධාරීන් දෙදෙනෙක් ඔවුන්ගේ වෘත්තිය සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් මෙහෙයවනු ලබන ඩිප්ලෝමා පාඨමාලා දෙකකට අනුයුක්ත කරන ලදී.

2.2.3. භෞතික පහසුකම් ළඟා කර ගැනීම්

මානව සම්පත් අභිවර්ධන ආයතනය භෞතික යටිතල පහසුකම්වල සැලකිය යුතු වර්ධනයක් අත්පත් කරගෙන ඇත.

- පැරණි මූල්‍ය ශාඛාවේ ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කරන ලදී.
- සරප් කවුන්ටරය සහ ගබඩා කාමර ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කරන ලදී.
- ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස ද්විචි-කාර්ය රථයක් ලබා ගැනීමට හැකි විය.

2.3 විදේශීය සහයෝගිතාවය සමග ශිෂ්‍ය කුසලතා වර්ධනය

- 2020 ජනවාරි මාසයේදී, මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ විද්වත් මැතිණියක් ආයතනයට පැමිණි අතර පශ්චාත් උපාධි විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන මට්ටම ඉහළ නැංවීම සඳහා ඇයගේ විශේෂඥ දැනුම බෙදා දෙන ලදී.

- එසේම, මලයා විශ්වවිද්‍යාලය ආයතනය හා එක්ව පර්යේෂණාත්මක සංස්කෘතිය තුළින් කාර්මික විපලවය 40 හි සංවර්ධිත රටක් ලෙස ශ්‍රී ලංකාව යන්න තේමා කොට ගත් සාකච්ඡා සංසදයක් සංවිධානය කරන ලදී.

2.4 මානව සම්පත් අභිවර්ධන ආයතනික සහභාගිත්ව සමාජ වගකීම්

- මානව සම්පත් අභිවර්ධන ආයතනය සෑම වසරකම පුණ්‍ය කටයුතු රාශියකට දායක වේ. 2020 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනයට මලයා විශ්වවිද්‍යාල ආරාධිත විද්වතෙකුගේ සහභාගිත්වයෙන් විවිධ වූ ග්‍රාහක සමූහ සඳහා සේවා-ඉගෙනුම් වැඩමුළු කිහිපයක් පැවැත්වීමට හැකි විය.

වැඩමුළුව	සම්පත් දායකත්වය	ඉලක්කගත ග්‍රාහක කණ්ඩායම
සේවා-ඉගෙනුම්	සත්ත්වවිද්‍යා සහ පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය	විද්‍යා පීඨ විද්‍යාර්ථීන්
සේවා-ඉගෙනුම්	ජාතික අධ්‍යාපන ආයතනය	විදුහල්පතිවරුන්
සේවා-ඉගෙනුම්	සේවා කළමනාකරණ ඒකකය	සේවා කළමනාකරණ විද්‍යාපති අධ්‍යයන වැඩසටහනේ විද්‍යාර්ථීන්
සේවා-ඉගෙනුම්	ශාන්ත ක්ලෙයාර් විද්‍යාලය, කොළඹ 06 - පාසල් සංචාරය	ශාන්ත ක්ලෙයාර් විදුහල් ගුරුවරුන්

2020 වර්ෂයේදී, මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් කෙළඹ විශ්වවිද්‍යාලයීය තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සහ පාසල් කිහිපයක් වෙත කාර්යාලයීය උපකරණ 171ක් පරිත්‍යාග කරන ලදි.

එම පරිත්‍යාග පහත දක්වා ඇත.

ආයතනය	කාර්යාලයීය උපකරණ සංඛ්‍යාව
තාක්ෂණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය	18
643 කොමාන්ඩෝ බ්‍රිගේඩ් සේනාංකය, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	79
බප/හො/ තක්ෂලා කුලුපන ප්‍රාථමික විද්‍යාලය	18
මො/ නාදුගල මහා විද්‍යාලය	14
මො/ කටුගහගල්ගේ ප්‍රාථමික විද්‍යාලය	12
ගබඩා අයිතම පරිත්‍යාග (බැහැර කිරීම)	
බප/හො/ තක්ෂලා කුලුපන ප්‍රාථමික විද්‍යාලය	30
එකතුව	171

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2020, මා.ස.අ.ආ.









වාර්ෂික සමාලෝචනය 2020

3.1 අධ්‍යයන වැඩසටහන් 2020 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය කාණ්ඩ පහක් යටතේ අධ්‍යයන වැඩසටහන් 19ක් පවත්වන ලදි.

පශ්චාත් උපාධි වැඩසටහන්

ප්‍රථම උපාධි වැඩසටහන

විධායක ඩිප්ලෝමා වැඩසටහන්

ඩිප්ලෝමා වැඩසටහන්

සහතිකපත්‍ර වැඩසටහන්

3.1.1 පශ්චාත් උපාධි වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනය පශ්චාත් උපාධි හතරක් (04) ඉදිරිපත් කරයි කෙසේ වෙතත්, 2020 වසරේදී විද්‍යාර්ථීන් ඇතුළත් කර ගනු ලැබුවේ. වැඩසටහන් තුනකට (03) පමණි. මානව සම්පත් අභිවර්ධන ආයතනය පශ්චාත් උපාධි හතරක් (04) ඉදිරිපත් කරයි. කෙසේ වෙතත්, 2020 වසරේදී විද්‍යාර්ථීන් ඇතුළත් කර ගනු ලැබුවේ වැඩසටහන් තුනකට (03) පමණි. සාමාන්‍යයෙන්, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා විද්‍යාර්ථීන් ඇතුළත් වන්නේ වෘත්තිය සංවර්ධනය වේගවත් කර ගැනීමට, තෝරාගත් අංශයන්හි දැනුම ප්‍රගුණ කර ගැනීමට, වෘත්තිය මාවත්වල ප්‍රගතියක් ලබා ගැනීමට, රැකියා අවශ්‍යතා පූරණය කර ගැනීමට සහ ඉපැයීමේ ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා වේ.

මානව සම්පත් අභිවර්ධන ආයතනය අබණ්ඩ ඇගයීම්, වැඩමුළු සහ ක්ෂේත්‍රයේ අධ්‍යයන චාරිකා සහ ජාලගත සම්මන්ත්‍රණ ඇතුළත් වූ ආවේණික වූ ඉගැන්වීම් ශෛලියක් භාවිත කරයි. මානව සම්පත් අභිවර්ධන ආයතනය සෑම විටම පාඨමාලා විෂය මාලා වැඩිදුර සංවර්ධනය සහ ශිෂ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාර්ථීන්ගෙන් ලබා ගන්නා ප්‍රතිපෝෂණ කෙරෙහි අවධානය යොමු කරයි. පශ්චාත් උපාධි වැඩසටහන් වෙළඳපොළ අවශ්‍යතා උදෙසා සැලසුම් කොට ඇත. මෙම පශ්චාත් උපාධි විද්‍යාර්ථීන් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දේ.

වර්තමානයේ, මානව සම්පත් අභිවර්ධන ආයතනය විද්‍යාර්ථීන් සඳහා කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා තුනක් (03) පවත්වාගෙන යනු ලබයි.

- ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව

ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ අවශ්‍යතා මානනය කෙරෙහි ව්‍යාපාර කළමනාකරණාධිපති පාඨමාලාව අවධානය යොමු කොට ඇත. එහිදී තරගකාරී, ගතික මෙන්ම සංකීර්ණ ව්‍යාපාරික පරිසරයේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා කළමනාකරණ වෘත්තිකයන් දැනුවත් කිරීමට පාඨමාලා ඒකක නිර්මාණය කොට ඇත.

ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලන ශාස්ත්‍රපති උපාධිය සහ ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලන විද්‍යාපති උපාධිය

කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය යනු ආපදා සහ අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයේ උපාධි පාඨමාලාවක් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රථම හා එකම ආයතනයයි. 2012 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලන ශාස්ත්‍රපති උපාධිය සහ ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලන විද්‍යාපති උපාධි වැඩසටහන් හඳුන්වා දෙන ලදි. ඕනෑම ආපදා සහ අවදානම් අවස්ථාවකදී, ආපදා සහ අවදානම් කළමනාකරණ වෘත්තිකයන්ට අවශ්‍ය වන්නා වූ ආපදා සහ අවදානම් කළමනාකරණ විශ්ලේෂණ හැකියාවන් පෝෂණය කිරීම මෙහි අරමුණ විය. මෙම වැඩසටහන් දෙකම, ආපදා සහ අවදානම් කළමනාකරණයේදී නිපුණතා සංවර්ධනය සහ හැකියාවන් වර්ධනයට ඉඩ සලසන ගතික මෙන්ම බහුකාර්ය වෘත්තිය වේදිකාවන් සම්පාදනය කරයි.

මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ වර්තමාන අවශ්‍යතා කෙරෙහි මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලාව අවධානය යොමු කොට ඇත. එහිදී තරගකාරී, ගතික මෙන්ම සංකීර්ණ ව්‍යාපාරික පරිසරයේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා මානව සම්පත් කළමනාකරණ වෘත්තිකයන් දැනුවත් කිරීමට පාඨමාලා ඒකක නිර්මාණය කොට ඇත.

සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය අපගේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඇති අද්විතීය පශ්චාත් උපාධි පාඨමාලාවකි. එය සේවා අංශයේ සේවා සම්බන්ධ ඕනෑම ගැටලුවකට මනා විශ්වාසයකින් මුහුණ දීම සඳහා අවශ්‍ය කරන්නා වූ සංකල්පීය සහ විශ්ලේෂණාත්මක මෙවලම් සම්පාදනය කෙරෙහි අවධානය යොමු කොට ඇත.



	වාර්ෂික ඇතුළත් කරගැනීම					උපාධිලාභීන් සංඛ්‍යාව				
	2016	2017	2018	2019	2020	2016	2017	2018	2019	2020
ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව	61	95	115	96	70	0	127	125	64	86
මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව	67	54	67	65	53	93	135	96	44	59
සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව	66	0	77	0	40	88	54	62	73	0
භූ තොරතුරු විද්‍යාපති උපාධි පාඨමාලාව	83	0	0	0	0	62	54	5	55	5
ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලනය විද්‍යාපති උපාධි පාඨමාලාව	0	0	48	0	0	26	38	11	3	0

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2020, මා.ස.අ.ආ.

- භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාව සඳහා 2016 වර්ෂයේ සිට විද්‍යාර්ථීන් ලියාපදිංචි කරගැනීමක් සිදු කර නොමැති අතර ලියාපදිංචි වූ විද්‍යාර්ථීන්ට පාඨමාලාව සම්පූර්ණ කිරීමට අනුමැතිය දී තිබුණි.
- විෂය නිර්දේශ සමාලෝචනයෙන් පසු 2021 වර්ෂයේදී විද්‍යාර්ථීන් බඳවා ගැනීමට කටයුතු කෙරුණි.

කෙසේවෙතත්, අවසන් ශිෂ්‍ය කණ්ඩායම 2018 වර්ෂයේදී බඳවා ගන්නා ලද සියලු පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්වල උපාධි පූර්ණ අනුපාතය 91% ක් විය.

3.1.2. ප්‍රථම උපාධි වැඩසටහන

3.1.2.1 ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය
3.1.2.2 ශ්‍රම කළමනාකරණවේදී උපාධිය

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රධාන අභිමතාර්ථ අතරින් එකක් වනුයේ අවශ්‍ය වන්නා වූ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක භාවයෙන් මානව කුසලතා වර්ධනය කර ගැනීම සහ ශ්‍රමික මෙන්ම කළමනාකරණාරුවන් සාමූහික වරණයන් සහ සාමූහික ප්‍රයත්නයන් සඳහා අධ්‍යාපනය ලබා දීමත් ය. එයට අනුව ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහන ආරම්භ කරන ලදී කෙසේවෙතත්, වෙළඳපොළ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සහ ශිෂ්‍යයින්ට පුළුල් අවස්ථා උදා කරමින් 2020 වර්ෂයේදී, ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහන හඳුන්වා දෙන ලදී.

2020 වර්ෂයේදී, අපේක්ෂයින් 762ක් ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහනට අයදුම් කළ අතර ඉන් 619ක් සිංහල මාධ්‍ය සඳහා ද 143ක් ඉංග්‍රීසි මාධ්‍ය සඳහා ද විය් එයින් 590ක් සිංහල මාධ්‍ය තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා ද 120ක් ඉංග්‍රීසි මාධ්‍ය තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා ද සුදුසුකම් ලැබීය. තවද, ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමාව සඳහා ලද අයදුම්පත් 159න් 128ක් තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන ලදී.

2020 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනයේ උපාධි වැඩසටහනේ සැලකිය යුතු වෙනසක් ඇති කරමින් නව උපාධි පාඨමාලාවක් හඳුන්වා දීමෙන් එහි වෙනසක් ඇති කළ වසරක් ලෙස 2020 වර්ෂය සනිටුහන් කරයි. මානව සම්පත් අභිවර්ධන ආයතනය ශ්‍රම කළමනාකරණවේදී උපාධිය සහ ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධිය පැවැත්වීම සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. මෙම වැඩසටහන් දෙකම කළමනාකරණ ක්ෂේත්‍රයේ පුළුල් විෂය ක්ෂේත්‍රයක් ආවරණය කරන අතර ඒවා ප්‍රථම වරට සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පැවැත්වේ. ශ්‍රම කළමනාකරණවේදී උපාධිය තුන් අවුරුදු වැඩසටහනක් වන අතර එය ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 5 වෙනි ස්ථරයට අයත් වේ. ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධිය සිව් අවුරුදු වැඩසටහනක් වන අතර එය ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 6 වෙනි ස්ථරයට අයත් වේ. අධ්‍යයන දිශානතියේ මෙම සැලකිය යුතු වෙනස්කම් සමග ලංකාවේ අංක එක ලෙසින් ශ්‍රේණිගත කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වන කොළඹ විශ්වවිද්‍යාලයෙන් තම උසස් අධ්‍යාපන කටයුතුවල නියැලීමෙන් පළපුරුද්ද මෙන්ම දැනුම ලබා ගැනීමට ද වෘත්තිය ජීවිතයේ ඉදිරියට ගමන් කිරීමට ද රැකියා නියුක්තිකයන්ට අභ්‍යන්තර උපාධියක් ලෙසින් මෙම නව අධ්‍යයන වැඩසටහන ඉතා යෝග්‍ය වනු ඇත.



මූලාශ්‍රය - රැස් කළ දත්ත 2020, මා.ස.අ.ආ.

*** ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවුවද රට තුළ උද්ගත වූ කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් 2020 වසරේදී සිසුන් බඳවා ගැනීම සිදු නොකරන ලදී. 2016 - 2020 කාලයේ සමස්ථ උපාධි පූර්ණ අනුපාතය 65%ක් විය.

3.1.3. විධායක/ උසස් ඩිප්ලෝමා වැඩසටහන්

විධායක/ උසස් ඩිප්ලෝමා වැඩසටහන් අදාළ සේවා ක්ෂේත්‍රයේ නියැලී සිටින වෘත්තිකයින් සඳහා සුවිශේෂී වූ සුදුසුකමකි. මෙම වැඩසටහන්හි ප්‍රධාන පරමාර්ථය වන්නේ කළමනාකරුවන්ට වැඩ කිරීමේදී පවරා ඇති ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට සහ යාවත්කාලීන කිරීමට අවස්ථා සැලසීමයි. මෙම පාඨමාලා දැනුම තවදුරටත් වර්ධනය කර ගත යුතු මධ්‍යම මට්ටමේ විධායකයින් සඳහා සැලසුම් කර ඇත. සියලුම විධායක ඩිප්ලෝමා වැඩසටහන් පුද්ගලික සංවර්ධනය කේන්ද්‍ර කොට ඇත්තේ, පාඨමාලා හදාරන්නන්ට ඔවුන්ගේම හැසිරීමේ චාර්යා රටාවන්ට අභියෝග කරමින් පෞද්ගලික අත්දැකීමක් ලෙස ගෙන තම සේවාදායකයින් සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීමේ පදනමට එය ඉතා වැදගත් වේයැයි ස්ථිර විශ්වාසයේ මුල් බැසගෙනය. මෙම පාඨමාලාවන් එක් වාර්ෂික පාඨමාලාවන් වේ. මානව සම්පත් අභිවර්ධන ආයතනය ඊටම ආවේණික වූ ඉගැන්වීම් ශෛලිය, අඛණ්ඩ ඇගයීම්, වැඩමුළු සහ ක්ෂේත්‍ර අධ්‍යයන හේතුවෙන් ශිෂ්‍යයින්ට ඔවුන් වෘත්තියභාවය සංවර්ධනය කර ගැනීමට වේදිකාව සම්පාදනය කරයි.

සංචාරක ව්‍යාපාරය යනු සමාජීය, සංස්කෘතික හා ආර්ථික සංසිද්ධියක් වන අතර එමගින් ව්‍යාපාරික හෝ වෘත්තිමය අරමුණු සඳහා මිනිසුන් තම සුපුරුදු පරිසරයෙන් බැහැරව වෙනත් රටකට හෝ වෙනත් ස්ථානයකට ගෙන යාමට ඉඩ සලසයි. සිදුවීම් යනු යම් වැදගත්කමක් ඇතිව සිදුවන හෝ සිදු වූ දෙයකි. සංචාරක ව්‍යාපාරයේදී හා වැදගත් සිදුවීම් යන දෙකටම ආගන්තුක සත්කාරය වැදගත් වන අතර එමගින් ආගන්තුකයාට විවේකයක් මෙන්ම සතුටක් එක් කරයි. සංචාරක, සිදුවීම් හා ආගන්තුක සත්කාර කළමනාකරණය අභියෝගයන්ට ලක්ව ඇති අතර සංචාරක, සිදුවීම් හා ආගන්තුක සත්කාර කළමනාකරණය අධ්‍යයනය සහ පර්යේෂණ කිරීම වැඩිදුර අධ්‍යයනයන් සඳහා හඳුන්වා දීමේ වැඩසටහනක් සහ වේදිකාවක් ලෙස සංචාරක, සිදුවීම් හා ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව දැක්විය හැකි සංචාරක, සිදුවීම් හා ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාවෙන් බලාපොරොත්තු වන්නේ සංචාරක සිදුවීම් සහ ආගන්තුක සත්කාරයේ සංකීර්ණතාවයන් ගවේෂණය කිරීම හා අවබෝධ කර ගැනීම සඳහා ක්‍රමානුකූල හා සංකල්පීය පදනමක් ලබා දීමටය. තවද, සංචාරක, සිදුවීම් හා ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව සැලසුම් කර ඇත්තේ සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර කර්මාන්තයේ දියුණුවට අවශ්‍ය දැනුම, කුසලතා සහ නිපුණතා ලබා දීම සඳහාය. මෙම වැඩසටහන මගින් සංචාරක කර්මාන්තයේ වෙනස්වන ස්වභාවය ගවේෂණය කිරීමට සහ ජාත්‍යන්තර වෙළඳපොළ වර්ගීකරණය කිරීම සඳහා උපායශීලී සැලසුම් සකස් කිරීමට ශිෂ්‍යයින්ට හඳුන්වා දෙනු ඇත.

විධායක ඩිප්ලෝමා පාඨමාලාවන්හි ශිෂ්‍ය කාර්යසාධනය 2016-2020



	වාර්ෂික ඇතුලත් කර ගැනීම					සුදුසුකම්ලත් සංඛ්‍යාව				
මානව සම්පත් කළමනාකරණය විධායක ඩිප්ලෝමාව	35	0	17	0	0	81	0	35	0	21
සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව	107	0	0	0	0	51	0	115	0	0
සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව	0	0	0	30	22	34	0	0	0	19
උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව	0	0	49	0	80	0	0	0	0	25

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2020, මා.ස.අ.ආ.

2020 වසරේදී ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කෙරුණේ සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව සහ උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව යන පාඨමාලා සඳහා පමණි. සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාවේ විෂය සමාලෝචන විධිමත් කිරීමේ කටයුතු වසර තුළ සිදු කෙරුණි. 2022 වසරේදී ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කෙරේ.

3.1.4 ඩිප්ලෝමා පාඨමාලා

මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් ඩිප්ලෝමා වැඩසටහන් 04ක් පිරිනමනු ලබන ලබයි ඒවා කළමනාකරණ, මානව ශාස්ත්‍ර සහ භාෂා පාඨමාලාවලින් සමන්විත වේ. මෙම පාඨමාලා මූලික මට්ටමේ රැකියා නියුක්තිකයන්ට තමන්ගේ අදාළ ක්ෂේත්‍රය තුළ දැනුම, විශ්ලේෂණාත්මක චින්තනය, හැකියාවන් ගොඩනැගීම, සදාචාරාත්මක ප්‍රමිතීන්, නායකත්වය සහ වගකීම් දැරීම දියුණු කිරීම සඳහා සහාය වීමට සැලසුම් කර ඇත. සිසුන්ට ඔවුන්ගේ විවිධ අවශ්‍යතාවන් සපුරා ගැනීමට මෙම ඩිප්ලෝමා පාඨමාලා මහෝපකාරී වේ. ඇතැම් අවස්ථාවල දී ඒවා අධ්‍යාපන කටයුතුවල විවිධ අවධීන් අතර ඇති පරතරය පුරවාලීම සඳහා හෝ අමතර වෘත්තීය පුහුණුවක් සහ සුදුසුකම් සැපයීම සඳහා උපකාරී වේ. තවද ඩිප්ලෝමා පාඨමාලාවක් මගින් වැදගත් විශේෂිත කුසලතා, දැනුම සහ අත්දැකීම් සම්පාදනය කරයි. වෘත්තිය මානසික සෞඛ්‍ය සේවාවට සම්බන්ධ වෘත්තිය උපදේශකවරයෙකු වීම සඳහා සිසුන්ට ශක්තිමත් පදනමක් තිබිය යුතුයි වෘත්තිය උපදේශකවරයෙකු වීම සඳහා තම කුසලතා වැඩි දියුණු කර ගැනීමට කවුරුන් හෝ අධ්‍යයන වැඩසටහනක් සොයන්නේ නම්, ඔහුගේ/ ඇයගේ අධ්‍යයන අරමුණ සාක්ශාත් කර ගැනීමට උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව විශිෂ්ඨ අවස්ථාවක් ලබා දේ.

මෙම පාඨමාලාව වෘත්තිය උපදේශකවරයෙකුගේ කාර්යභාරය කෙරෙහි ඉලක්ක කොට ශක්තිමත් පදනමක් ලබා දීමට නිර්මාණය කර ඇත. මෙම වැඩසටහනේ ප්‍රායෝගික අංග සේවා පරිශීලකයා සමග ශක්තිමත් සම්බන්ධතාවක් ගොඩ නඟා ගැනීමට මෙන්ම ඔවුන්ගේ ජීවිතයේ යහපත් දියුණුවක් ඇති කර ගැනීමට මඟ පෙසන්වීම සඳහා පුද්ගලයෙකුගේ මූලික උපදේශන කුසලතා ශක්තිමත් කරනු ඇත. උපදේශන මනෝවිද්‍යා ඩිප්ලෝමාව හැදෑරීමෙන් ශිෂ්‍යයින් මූලික උපදේශන ක්‍රම සහ ප්‍රවේශයන් ඉගෙන ගනු ඇත.

2020 වසරේදි, ඩිප්ලෝමා පාඨමාලා දෙකක් (02) සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම සිදු කෙරුණි. ඒ මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණය ඩිප්ලෝමාව සහ උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාවයි. එමෙන්ම සේවා කළමනාකරණ ඩිප්ලෝමාව සඳහා ද අයදුම්පත් කැඳවන ලද අතර එහි බඳවා ගැනීමේ කාල සීමා 2021 ජනවාරි මස දක්වා දීර්ඝ කරන ලදී.

ඩිප්ලෝමා පාඨමාලාවන්හි ශිෂ්‍ය කාර්යසාධනය 2016-2020



	වාර්ෂික ඇතුළත් කර ගැනීම					සුසුසුකම්ලත් සංඛ්‍යාව				
	2016	2017	2018	2019	2020	2016	2017	2018	2019	2020
සේවා කළමනාකරණ ඩිප්ලෝමාව	20	0	0	0	0	37	0	27	11	0
මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණය ඩිප්ලෝමාව	0	0	0	46	40	0	0	27	0	28
උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව	0	0	49	0	78	23	55	29	29	15
අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව	124	96	90	92	0	123	100	74	73	0

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2020, මා.ස.අ.ආ.

3.1.5. සහතිකපත් පාඨමාලා

මානව සම්පත් අභිවර්ධන ආයතනය ශිෂ්‍යයින්ගේ වෘත්තිමය සංවර්ධනය ඉලක්ක කොට විවිධ විෂය ක්ෂේත්‍රයන්හි සහතිකපත් පාඨමාලා අටක් (08) පිරිනමනු ලබයි. මෙම වැඩසටහන්වල විස්තර පහත ප්‍රස්ථාර හා වගු මගින් පෙන්වා ඇත. මෙම වැඩසටහන්වල පාඨමාලා කාල සීමාව මාස 03 සිට මාස 08 දක්වා වේ.

වර්තමානයේ සිසුන්, ශිෂ්‍ය කේන්ද්‍රීයව නොව මාර්ගගත අධ්‍යයනයට යොමු කර ඇත. ආරම්භයේදී මාර්ගගත ඉගෙනුම් වෙත යොමු වීමේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විවිධ තාක්ෂණික ගැටලු රාශියකට මුහුණ දුන්නේය. කෙසේ වුවද වර්තමානයේ සියලු අධ්‍යයන වැඩසටහන් මාර්ගගත ඉගෙනුම් ක්‍රමය භාවිතයෙන් සුමටව ක්‍රියාත්මක වේ.

2020 අධ්‍යයන වර්ෂයේ දී, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සිසුන් බඳවා ගැනීම සිදු කෙරුණේ සහතික පත්‍ර පාඨමාලා හතරක (04) පමණි. ශිෂ්‍යයින් එක්දහස් අසූතුනක් (1,083) ලියාපදිංචි වූ අතර, 2020 වසර තුළ සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව දෙදහස් නවසිය පනස් හතරකි (2,954) පාස්කු ප්‍රහාරයෙන් පසුව පැවති වාතාවරණය හේතුවෙන් සහතික පත්‍ර පාඨමාලා කාලය දීර්ඝ කිරීමට සිදු විය. ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව සහ කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව යන පාඨමාලාවන්හි අධ්‍යයන කටයුතු තාවකාලිකව නැවැත්වීමට සිදු විය.



	වාර්ෂික ඇතුළත් කර ගැනීම					සුදුසුකම් ලත් සංඛ්‍යාව				
	2016	2017	2018	2019	2020	2016	2017	2018	2019	2020
ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව	1321	1321	2283	1938	512	0	986	1523	0	1422
ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව	217	0	413	429	64	0	143	269	0	300
ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව	67	0	48	52	0	0	55	25	0	44
කථන ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව	3637	1933	580	383	0	2706	1471	0	391	239
පාසල් හැරයන්නන් ඉංග්‍රීසි භාෂා කෙටිකාලීන පාඨමාලාව	130	54	342	507	213	0	45	101	390	444
පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව	452	0	412	423	0	320	336	275	347	148
දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික	341	405	327	427	284	242	203	0	196	261
දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම	160	145	157	110	0	159	109	104	115	96

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2020, මා.ස.අ.ආ.

3.2. 2020 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු

මානව සම්පත් අභිවර්ධන ආයතනය තුළ, පශ්චාත් උපාධි, උපාධි සහ ඩිප්ලෝමා හදාරන ශිෂ්‍යයින් ඔවුන් අදාළ අධ්‍යයන පාඨමාලාවේ අනිවාර්ය අංගයක් ලෙස වැඩමළුවලට සහභාගී විය යුතුය. මෙම වැඩසටහන්වල අරමුණ ශිෂ්‍යයින්ගේ වෘත්තීය සංවර්ධනයයි. දේශන මෙන් නොව, වැඩමුළු මගින් වෘත්තිය ලෝකයට අවශ්‍ය මානෘකා පිළිබඳ විවෘතව සාකච්ඡා කිරීමට සහ නව අදහස් ඉදිරිපත් කිරීමට සංවාදාත්මක සාකච්ඡා සඳහා දිරි ගන්වනු ලබයි.

සහභාගීවන්නන්ට ගැටලු හමුවේ මුහුණ දීමේ දී ගැටලු නිරාකරණයට ඔවුන්ගේ දෘෂ්ටිය අනුව ගැටලු විසඳා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ අදහස් හුවමාරු කර ගත හැකි. නව කුසලතා දියුණු කර ගැනීමට වැඩමුළු උපකාරී වන අතර එය ශිෂ්‍යයින්ගේ ප්‍රගතිය කෙරෙහි උපකාරී වේ. ශිෂ්‍යයින්ට ඔවුන්ගේ ඉදිරිපත් කිරීමේ, නායකත්වයේ, සන්නිවේදනයේ, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගත හැකිය.

මෙම වැඩසටහන්වල ඉලක්කය වූයේ සන්නිවේදනයෙන් ආරම්භ කොට විවිධ පරිසරවල මෘදු කුසලතා සංවර්ධනය චින්ත සංවේදීතාව සංවර්ධනය කිරීම, නිර්මාණශීලී සහ අවදානම් තීරණ ගැනීම් ඉගෙනුම, එක්ව වැඩ කරන්නේ කෙසේද යන්න පිළිබඳ ඇති දැනුවත්බව සහ මිනිසුන් සමඟ සාකච්ඡා කිරීම දියුණු කිරීම, අන්‍යයන්ගෙන් සහ ඔවුන් තුළම ඇතිවන ආතතිය සහ ගැටුම් දුරලීම වැනි පුළුල් පරාසයක පැතිර ඇති මෘදු කුසලතා වර්ධනය කිරීමයි. 2020 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය, ශිෂ්‍යයින්ගේ, රාජ්‍ය/පෞද්ගලික අංශවල සේවා නියුක්තිකයන්ගේ දැනුම, කුසලතා, ආකල්ප, වැඩි දියුණු කිරීමේ අරමුණින් පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි, සහ ඩිප්ලෝමා පාඨමාලාවල ලියාපදිංචිව සිටින සිසුනට පුහුණු වැඩමුළු 05ක් පවත්වන ලදි.

වර්ගය	වැඩමුළුව	සහභාගි වූ සංඛ්‍යාව	ඉලක්ක කණ්ඩායම
වැඩමුළු	කළමනාකරණ මූලධර්ම	172	ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව - ප්‍රථම වසර
	සංචාරක ව්‍යාපාරයේ නෛතික පැතිකඩ	29	සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව
	සමාජ විද්‍යා සඳහා වූ සංඛ්‍යාන විද්‍යාත්මක පැකේජය (SPSS) පුහුණු වැඩමුළුව	79	ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව - තෙවන වසර
	ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ මාර්ගගත වැඩමුළුව	130	ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව - තෙවන වසර
වෙනත් (විශේෂ)	Sri Lanka as a Developed Country in Industrial Revolution 4.0 through Research Culture මැයෙන් සාකච්ඡා සංසදය	70	මලයා විශ්වවිද්‍යාලයෙන් සංවිධානය කරන ලද විධායක සම්මන්ත්‍රණයේ පාර්ශවකරුවන්

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2020, මා.ස.අ.ආ.

3.2.1. 2020 වර්ෂයේ මානව සම්පත් අභිවර්ධන ආයතන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්

වැඩසටහන	වෘත්තීමය තත්වය/ සහභාගිත්වය	දිනය	ස්ථානය
සමාජ විද්‍යා සඳහා වූ සංඛ්‍යාන විද්‍යාත්මක පැකේජය (SPSS) හැඳින්වීම සහතික පත්‍ර පාඨමාලාව	ඩබ්.ඩී.එන්. අසංගිකා විද්‍යාත්මක සහකාර - ශ්‍රේණිය II	2020 ජනවාරි මස 18, 19, 25 සහ 26	මානව ශාස්ත්‍ර සහ සාමාජීය විද්‍යා උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය
304100	10369	R003	පාසල් හැරයන්නන් සඳහා වූ කෙටිකාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව - අංක 26	725,144
304100	10370	R003	ආපදා කළමනාකරණ හා පාලන විද්‍යාපති පාඨමාලාව	938,000
304100	10371	R003	මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණය ඩිප්ලෝමාව - 2020	299,410
304100	10372	R003	පාසල් හැරයන්නන් සඳහා වූ කෙටිකාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව - අංක 27	416,962
304100	10373	R003	ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලාව - අංක 40	5,104,973
304100	10374	R003	සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව - 2020	1,431,249
304100	10376	R003	උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව - 2020	363,961
304100	10377	R003	ශ්‍රම අධ්‍යාපනවේදි උපාධිය - 2020	930,855
304100	10378	R003	ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමාව - 2020	147,600
304100	10379	R003	පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව - අංක 12	2,507,961
304100	10380	R003	දමිළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව (මූලික) - අංක 16	81,961
304100	10383	R003	ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව - අංක 08	778,800
			එකතුව	**97,101,498**

සටහන 13 - විගණන ගෙවීම් සඳහා වෙන් කිරීම්

විස්තරය		අගය
01.01.2019	**ආරම්භක ශේෂය**	784,080
	වසර තුළ ගෙවීම්	-
	වසර සඳහා වෙන් කිරීම්	672,000
31.12.2019	**අවසන් ශේෂය**	**1,456,080**

සටහන 14 - පාරිතෝෂික සඳහා වෙන් කිරීම් - 2020

විස්තරය	අධ්‍යයන	අනධ්‍යයන	එකතුව
2020.01.01 දිනට ශේෂය	9,980,114	17,892,845	**27,872,959**
පෙර වර්ෂයට ගැලපීම්	790,243	1,462,127	**2,252,370**
2020 වසරේ පාරිතෝෂික	764,448	(86,363)	**678,085**
2020.12.31 දිනට ශේෂය	**11,534,805**	**19,268,608**	**30,803,413**

සටහන 15 - සීමා කරන ලද අරමුදල්

විස්තරය	අගය
පුහුණු හා සංවර්ධන අරමුදල	442,313
පර්යේෂණ ප්‍රතිපාදන අරමුදල	908,573
සුභසාධන හා සමාජ වගකීම් අරමුදල	2,615,947
එකතුව	**3,966,833**

සටහන 16 - එකාප්ති වැඩසටහන්වලින් ලද ආදායම් ප්‍රකාශය - 2020

විස්තරය	අගය
අයදුම්පත් ගාස්තු	1,336,900
පාඨමාලා ගාස්තු	63,977,471
ලියාපදිංචි ගාස්තු	1,944,000
විභාග ගාස්තු	4,311,000
පුස්තකාල ගාස්තු	778,000
වෙනත් ආදායම්	965,400
එකතුව	**73,312,771**

සටහන 17 - වෙනත් ආදායම් ප්‍රකාශය - 2020

විස්තරය	අගය
ලියාපදිංචි ගාස්තු - උපාධි අපේක්ෂක	1,318,000
විභාග ගාස්තු - උපාධි අපේක්ෂක	29,250
ණය සහ අත්තිකාරම්වලින් ලද පොළිය	275,994
කෙටි කාලීන තැන්පත් පොළිය	31,746,433
දේපළ කුළී ආදායම් ගිණුම	3,240
පැරණි තොග විකිණීම	1,000
පුස්තකාල දඩ	60
විවිධ ලැබීම්	2,035,437
උපාධි ලෝගු කුළියට දීම්	111,200
ප්‍රකාශන විකිණීම	140,400
එකතුව	**35,661,014**

Note 18 - Statement of Expenditure in 2020

Account Number	Description	Amount	Total
410101-90000-P001	Personel Emoluments Academic, Admin, Salaries & Wages	9,768,735	
410101-90000-P002	Personel Emoluments Academic, Admin, E.P.F	2,565,252	
410101-90000-P003	Personel Emoluments Academic, Admin, Pension	1,156,048	
410101-90000-P004	Personel Emoluments Academic, Admin, E.T.F	744,260	
410101-90000-P005	Personel Emoluments Academic, Admin, Acting Pay	149,527	
410101-90000-P008	Personel Emoluments Academic, Admin, Acadamic Allowances	13,654,542	
410101-90000-P011	Personel Emoluments Academic, Admin, Visiting Lecture Fees	762,555	
410101-90000-P012	Personel Emoluments Academic, Admin, Gratuity	764,448	
410101-90000-P013	Personel Emoluments Academic, Admin, Cost Of Living	904,800	
410101-90000-P015	Personel Emoluments Academic, Admin, Research Allowance	3,695,363	
410101-90000-P016	Personel Emoluments Academic, Admin, Sp. Allowance 15% - Aca	1,934,785	
410102-90000-P001	Personel Emoluments Non Academic, Admin, Salaries & Wages	22,523,015	
410102-90000-P002	Personel Emoluments Non Academic, Admin, E.P.F	3,170,871	
410102-90000-P003	Personel Emoluments Non Academic, Admin, Pension	2,340,108	
410102-90000-P004	Personel Emoluments Non Academic, Admin, E.T.F	1,102,415	
410102-90000-P006	Personel Emoluments Non Academic, Admin, Interim Allowances	840,710	
410102-90000-P007	Personel Emoluments Non Academic, Admin, M.C.A	9,238,252	
410102-90000-P010	Personel Emoluments Non Academic, Admin, Other Allowances	60,000	
410102-90000-P012	Personel Emoluments Non Academic, Admin, Gratuity	(86,364)	
410102-90000-P013	Personel Emoluments Non Academic, Admin, Cost Of Living	4,117,888	
410102-90000-P014	Personel Emoluments Non Academic, Admin, Arrears-M.C.Allowan	257,514	
410102-90000-P015	Personel Emoluments Non Academic, Admin, Research Allowance	363,888	
410102-90000-P016	Personel Emoluments Non Academic, Admin, Sp. Allowance 15% -	4,499,660	
410102-90000-P017	Personel Emoluments Non Academic, Admin, Over Time	1,035,144	**85,563,416**
410106-90000-P031	Supplies, Admin, Stationery & Office Requisites	1,866,815	
410106-90000-P032	Supplies, Admin, Fuel & Lubricans	948,325	
410106-90000-P036	Supplies, Admin, Other Supplies	1,502,964	**4,318,104**
410107-90000-P040	Maintanance, Admin, Vehicles	548,779	
410107-90000-P041	Maintanance, Admin, Plant,Mechinary & Equipment	215,649	
410107-90000-P042	Maintanance, Admin, Building & Structure	7,000	
410107-90000-P044	Maintanance, Admin, Others	1,371,794	**2,143,221**
410108-90000-P050	Contractual Services, Admin, Transport	61,309	
410108-90000-P051	Contractual Services, Admin, Telecommunication	1,284,103	
410108-90000-P052	Contractual Services, Admin, Posted Chages	105,000	
410108-90000-P053	Contractual Services, Admin, Elecricity	1,866,368	
410108-90000-P054	Contractual Services, Admin, Security Service	1,164,534	
410108-90000-P055	Contractual Services, Admin, Water	53,127	
410108-90000-P056	Contractual Services, Admin, Cleaning Service	378,599	
410108-90000-P057	Contractual Services, Admin, Rents & Hire Chages	163,400	
410108-90000-P058	Contractual Services, Admin, Rates & Tax To Local Authoriti	11,230	
410108-90000-P059	Contractual Services, Admin, Printing,Advertising Ect	1,235,854	**6,323,525**
410109-90000-P062	Other Recurrent Expenses, Admin, Special Service-Council & C	829,500	
410109-90000-P063	Other Recurrent Expenses, Admin, Special Service-Professiona	147,244	
410109-90000-P068	Other Recurrent Expenses, Admin, Holiday Warrants & Season T	207,280	
410109-90000-P069	Other Recurrent Expenses, Admin, Entertainment Expenses	444,814	
410109-90000-P071	Other Recurrent Expenses, Admin, Awards & Indemnities	84,050	
410109-90000-P073	Other Recurrent Expenses, Admin, Convacation	2,723,000	
410109-90000-P074	Other Recurrent Expenses, Admin, Examination Expenses	908,890	
410109-90000-P075	Other Recurrent Expenses, Admin, Other Exp.News Papers,Mag	2,759,172	
410109-90000-P079	Other Recurrent Expenses, Admin, Welfere Insurance	1,076,139	
410109-90000-P084	Other Recurrent Expenses, Admin, Interest Sub.On Prop.Loan	39,043	**9,219,132**
420101	Depreciation A/C - Lands & Buildings	4,004,598	
420102	Depreciation A/C - Office Equipment	6,842,451	

Account Number	Description	Amount	Total
420103	Depreciation A/C - Library Books & Perio	86,998	
420104	Depreciation A/C - Motor Vehicles	813,334	
420106	Depreciation A/C - Name Board	19,950	
420107	Depreciation A/C - Cloark	386,634	
420108	Depreciation A/C - Furniture	1,833,067	
420109	Depreciation A/C - Electrical Items	3,589,048	
420110	Depreciation A/C - Software	69,000	**17,645,080**
Total			**125,212,479**

සටහන 19 - අණාවරණ

නඩු අංක. 08/177/2017

මැදවච්චියේ සිට ත්‍රිකුණාමලය දක්වා යෝජිත දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ ගෙවීම

ඉහත ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය 2012 ජනවාරි 12වන දින ප්‍රවාහන අමාත්‍යාංශය සමග ගිවිසුමකට එළඹී අතර එහි මුළු කොන්ත්‍රාත් මුදල රුපියල් 15,703,000.00 ක් විය. මානව සම්පත් අභිවර්ධන ආයතනය මෙම කොන්ත්‍රාත්තුවෙන් රුපියල් 10,992,000.00 ක මුදලක් ලබා ගත් අතර එය ව්‍යාපෘති ආදායමක් ලෙස සටහන් විය. 2021 ජනවාරි මස 22 දින ප්‍රවාහන අමාත්‍යාංශයෙන් ලද ලිපියකට අනුව, රටේ පවතින ආර්ථික වතාවරණය හේතුවෙන් ඉතිරි මුදල් නිදහස් කිරීමට අමාත්‍යාංශයට හැකියාවක් නොමැති බව සඳහන් කර ඇති අතර ඒ වන විට කර ඇති ගෙවීම් මත ගනුදෙනුව අවසන් කරන ලෙස ඉල්ලා සිටියේය.

සටහන 20 - සම්බන්ධිත පාර්ශව අණාවරණය

එස්.එල්.පී.එස්.ඒ.එස්. 14 ට අනුව - සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම: ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් යනු ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම් ඇති අයයි. ඒ අනුව අධ්‍යයන සභා සාමාජිකයින් ආයතනයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර ඇත. වර්ෂය තුළ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ෂෂෂ වන කොටසේ අංක 17 (ඇ) යටතේ දක්වා ඇති තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව - 2020

1. හැඳින්වීම

මානව සම්පත් අභිවර්ධන ආයතනය, 1979 අංක 11 නියමාවලිය මගින් සේවක අධ්‍යාපන ආයතනය නමින් ස්ථාපිත කරන ලද අතර එය වර්ෂ 2006 අංක 01 නියමාවලිය මගින් සංශෝධනය කරනු ලැබිණ. 2006 වසරේදී සේවක අධ්‍යාපන ආයතනය මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලදි. මානව සම්පත් අභිවර්ධන ආයතනය රටේ පැරණිතම විශ්වවිද්‍යාලය වන කොළඹ විශ්වවිද්‍යාලයට අයත් අධ්‍යයනායතනයකි. කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයට ලක්වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

මානව සම්පත් අභිවර්ධන ආයතනය 2018 - 2022 කාල පරාසය සඳහා ආයතන සංයුක්ත සැලැස්ම සැකසීමේ සිට ක්‍රියාකාරී සැලැසුම් තුළින් අපේක්ෂිත අරමුණු ඉලක්ක කරා ගමන් කරමින් සිටී. සෑම රාජ්‍ය ආයතනයක් මෙන්ම මානව සම්පත් අභිවර්ධන ආයතනය ද එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය අනුව, තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් අපගේ ආයතනික අරමුණු සහ ඉලක්කද කේන්ද්‍රගත කොට ඇති බව සතුටින් දැනුම් දීමට කැමැත්තෙමු. අපගේ 2018 - 2022 ආයතන සංයුක්ත සැලැස්ම ප්‍රධාන වශයෙන් ගුණාත්මක අධ්‍යාපනය, පරිසරය සුරැකීම සහ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව යන අංගයන් වෙත අපගේ මූලික අවධානය යොමු කොට ඇත.

2. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2018 - 2022 කාල පරාසය සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව ආයතනික ඉලක්ක සහ අරමුණු

ඉලක්කය		අරමුණු
01	උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහ පුළුල් සහභාගිත්වය	■ විශේෂයෙන් උසස් අධ්‍යාපනය සඳහා විධිමත් අධ්‍යාපනයක් ලබා ගත නොහැකි පුද්ගලයන් දැනුවත් කිරීම. ■ මාර්ගගත ඉගෙනුම්-ඉගැන්වීම් අධ්‍යපනය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම.
02	අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම	■ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම ■ කාර්මික අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහන් වැඩි දියුණු කිරීම ■ අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම සඳහා උපාධි ගුණාංග වැඩි දියුණු කිරීම
03	පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම	■ විද්වතුන් හා විද්‍යාර්ථීන් අතර පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම ■ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා අධාර කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ■ විශිෂ්ට පුස්තකාල සේවාවක් පුරුදු කිරීම
04	සමාජ ආර්ථික සංවර්ධනයේදී උපාය මාර්ගික හවුල්කාරිත්වය වැඩි කිරීම	■ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අවශ්‍යතා සඳහා දැනුම පැවරීම ■ ප්‍රජාවන්ගේ යහපත උදෙසා ශාස්ත්‍රීය දැනුම සහ අත්දැකීම් නුවමාරු කොට ගෙන ප්‍රයෝජනයට ගැනීම

05	ජාත්‍යන්තර සහයෝගීතාව සහ තරගකාරිත්වය වැඩි කිරීම	■ උසස් අධ්‍යාපනයේ ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම ■ හවුල්කාරිත්වයන් ගොඩ නගා ගැනීමෙන් වර්ධනය සහ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම
06	භෞතික හා සෞන්දර්ය පරිසරය වැඩි දියුණු කිරීම තුළින් පාර්ශවකරුවන්ගේ සංතෘප්තිය	■ යහපත් පරිසරයක් සම්පාදනය සඳහා භෞතික පහසුකම් පුළුල් කිරීම ■ සොබාදහම සංරක්ෂණය පෙරදැරි කොට ගෙන ප්‍රසන්න වාතාවරණයක් ඇති කිරීම ■ සේවක තෘප්තිය වැඩි කිරීම
07	පරිපාලන පද්ධතිය සහ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම	■ ආයතනය තුළ පිරිසිදු භාවිතයන් උපයෝජනය කිරීම ■ ශිෂ්‍ය කේන්ද්‍රීය විශිෂ්ට පරිපාලන ක්‍රියාවලියක් පුරුදු කිරීම ■ විශිෂ්ට කාර්යාල පරිපාලන පද්ධතියක් පුරුදු කිරීම ■ ආයතනයේ ගුරුවරුන්ට මෙන්ම ශිෂ්‍යයින්ට සහ පර්යේෂකයින්ට සහාය වීම සඳහා පහසු ප්‍රවේශයක් සහ තොරතුරු සේවාවන් සැපයීම ■ සේවක කැපවීම වැඩි දියුණු කිරීම
08	මූල්‍ය කළමනාකරණය සහ තිරසාරබව වැඩි දියුණු කිරීම	■ වැඩසටහන්වලින් ආදායම වැඩි දියුණු කර ආයතනයට මූල්‍ය ප්‍රතිලාභ අත් කර දීම ■ සියලු ප්‍රධාන ක්‍රියාවලින්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ වැඩසටහන් ඉදිරිපත් කිරීමේ පිරිවැය අවම කිරීම ■ ආයතනයට අනාගත මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම සඳහා ප්‍රාග්ධනය සහ අනෙකුත් උපායමාර්ගික ආයෝජන ව්‍යාපෘති කළමනාකරණය කිරීම
09	යහපාලනය පුළුල් කිරීම	■ යහපාලනතන්ත්‍රය ස්ථාපිත කිරීම

ඒ අනුව පසුගිය 2020 වසර තුළ ආයතන ක්‍රියාකාරී සැලැස්ම මගින් බලාත්මක කෙරුණු තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව මෙසේ එළි දක්වමු. එම ළඟා කර ගැනීම් පහත පරිදි වේ.

ශ්‍රම කළමනාකරණවේදී උපාධිය හඳුන්වා දීම

මෙම ප්‍රථම උපාධි පාඨමාලාව දෙඅංශයකින් යුක්ත වේ. ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධිය සිවි අවුරුදු වැඩසටහනක් වන අතර එය ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 6 වෙනි ස්ථරයට අයත් වේ. ශ්‍රම කළමනාකරණවේදී උපාධිය තුන් අවුරුදු වැඩසටහනක් වන අතර එය ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 5 වෙනි ස්ථරයට අයත් වේ.

පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 9 වෙනි සහ 10 ස්ථර අනුකූලව අනුමැතිය ලබා ගැනීම

සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය, මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති උපාධිය, ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිය, සේවා කළමනාකරණාධිපති උපාධිය, මානව සම්පත් කළමනාකරණාධිපති උපාධිය, ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධිය.

ආයතනයේ පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලාවහි සුදුසුකම්ලාභීන්ගේ ගුණාංග හඳුන්වා දීම

2020 වසරේදී, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පවත්වනු ලබන සියලු ඩිප්ලෝමා පාඨමාලාවන්හි විෂය ඒකක කාර්මික අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි සංවර්ධනය කිරීමට කටයුතු කරල දී. ඒ අනුව, සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව, සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව සහ සේවා කළමනාකරණ ඩිප්ලෝමාවේ සුදුසුකම්ලාභීන්ගේ ගුණාංග දැනටමත් හඳුනාගෙන ඇති අතර අනෙක් ඩිප්ලෝමා පාඨමාලාවන්හි එම කටයුතු සිදුවෙමින් පවති.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී අන්තර් ක්‍රියාකාරී ක්‍රම ප්‍රවර්ධනය කිරීම

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පවත්වනු ලබන ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහන, සියලු පශ්චාත් උපාධි වැඩසටහන්, සියලු උසස්/ විධායක ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා මෙන්ම සහතික පත්‍ර වැඩසටහන්වල සාර්ථකව ක්‍රියාත්මක වේ. නුදුරේදී ශ්‍රම කළමනාකරණවේදී උපාධිය සඳහා ද උපයෝජනය කිරීමට කටයුතු කෙරේ.

ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ භාවිතය පුළුල් කිරීම

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පවත්වනු ලබන සහතිකපත් පාඨමාලාවන් හැරුණු කොට ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහන, සියලු ශාස්ත්‍රපති උපාධි වැඩසටහන්, සියලු උසස්/ විධායක ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා යන අනෙක් සෑම පාඨමාලාවකම ලියාපදිංචි වන සෑම ශිෂ්‍යයෙක්ම ඔවුනගේ අධ්‍යයන අවශ්‍යතා සඳහා ඉගෙනුම්

කළමනාකරණ පද්ධතිය භාවිත කිරීම අනිවාර්ය වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මිශ්‍ර ඉගෙනුම් (Blended Learning System) ක්‍රමය භාවිත කිරීම
කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් කථිකාචාර්යවරුන් සියලුම අධ්‍යයන වැඩසටහන්වල මිශ්‍ර ඉගෙනුම් (Blended Learning System) ක්‍රමය භාවිතයෙන් තම දේශන පවත්වාගෙන යනු ලබයි. උදාහරණයක් ලෙසින් ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි වැඩසටහනේ දී

- වර්තමානයේ සියලුම කථිකාචාර්යවරුන් තම විෂයන්ට අදාළ දේශන මිශ්‍ර ඉගෙනුම් (Blended Learning System) ක්‍රමය භාවිතයෙන් සිදු කිරීම.

- පැවරුම් ඉදිරිපත් කිරීම ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා සිදු කෙරේ.

- මුද්‍රිත ඉගෙනුම් අධාරක ලබා නොදේ. ඉගෙනුම් අධාරක ලබා ගැනීම සඳහා සිසුන් අදාළ ඉගෙනුම් කළමනාකරණ පද්ධති ගිණුමට ප්‍රවිශ විය යුතුය. (උදා: පැවරුම්, සටහන්, වීඩියෝ, ප්‍රශ්නාවලි - ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය උඩුගත කෙරේ)

- දේශන සඳහා ශිෂ්‍ය සහභාගිත්වය ඩිජිටල් සහභාගිත්ව ක්‍රමවේදයක් වන ඕෆුස් ක්‍රමය ඔස්සේ ලබා ගැනේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පශ්චාත් උපාධි පුහුණුව ලබා දීම
අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙක් දේශීයව පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කළ අතර, වර්ෂය තුළ එක් සාමාජිකයෙක් විදේශගතව පශ්චාත් උපාධිය සඳහා අධ්‍යයනය කටයුතු කරමින් සිටී.

පර්යේෂණ ප්‍රතිඵල පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම
ආයතනයේ කථිකාචාර්යවරු 6 දෙනෙක් විමර්ශිත ජර්නලවල තම පර්යේෂණ පත්‍රිකා 13ක් ප්‍රකාශයට පත් කොට ඇත.

විශිෂ්ට පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කිරීම
පුස්තකාල තොරතුරු පද්ධතිය සහ ඩී-අවකාශ මෘදුකාංගය ස්ථාපනය කිරීම සිදු වෙමින් පවති.

ප්‍රජාවන්ගේ යහපත උදෙසා ශාස්ත්‍රීය දැනුම සහ අත්දැකීම් හුවමාරු කොටගෙන ප්‍රයෝජනයට ගැනීම
ප්‍රජා සංවර්ධන වැඩසටහන් ලෙස පහත සඳහන් වැඩමුළු ආයතනය විසින් දියත් කරන ලදී. මෙම වැඩමුළු මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ AUA විද්වත් මහාචාර්ය විශාලච්චි බාලකෘෂ්ණන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

වැඩමුළුව	සම්පත් දායකත්වය
සේවා-ඉගෙනුම් 01	සත්ත්වවිද්‍යා සහ පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
සේවා-ඉගෙනුම් 02	ජාතික අධ්‍යාපන ආයතනය
සේවා-ඉගෙනුම් 03	සේවා කළමනාකරණ ඒකකය
සේවා-ඉගෙනුම් 04	ශාන්ත ක්ලෙයාර් විද්‍යාලය, කොළඹ 06 - පාසල් සංචාරය

එමෙන්ම, මලයා විශ්වවිද්‍යාලය හා ආයතනය එක්ව "පර්යේෂණාත්මක සංස්කෘතිය තුළින් කාර්මික විප්ලවය 40 හි සංවර්ධිත රටක් ලෙස ශ්‍රී ලංකාව" යන්න තේමා කොට ගෙන පවත්වන ලද සාකච්ඡා සංසදය සඳහා ආයතනයේ හිටපු අධ්‍යක්ෂ දිවංගත මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා ප්‍රධාන කථිකයෙකු ලෙසින් සහභාගි විය.

අධ්‍යාපනයේ අයිතිය ප්‍රවර්ධනය කරන සංවිධාන සමග සම්බන්ධතා ගොඩ නගා ගැනීම

- මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සිදු වෙමින් පවති.
- ගල්කිස්ස හෝටලයේ සහයෝගිතාවයෙන් සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කෙරුණු අතර එහි අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සිදු වෙමින් පවති.

පරිසර හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම
බලශක්ති ඉතිරි කිරීමට මුලපිරීම සඳහා ආයෝජනය කිරීම, විදුලි පහන් සඳහා LED සහ සී.එෆ්.එල්. බල්බ භාවිතය වැඩි කිරීම, මුද්‍රණ යන්ත්‍ර භාවිතය අඩු කිරීම, ඒකක සඳහා මුද්‍රණ යන්ත්‍ර භාවිතය, ආයතන පරිශ්‍රය තුළ ප්ලාස්ටික්-පොලිතින් භාවිතය අවම කිරීම සඳහා ක්‍රියා කිරීම, කසල බැහැර කිරීමේදී අපද්‍රව්‍ය දිරාපත් වන සහ නොවන ලෙස වෙන් කිරීමේ වැදගත්කම පිළිබඳව සේවක දැනුවත්භාවය වැඩි කිරීම.

සේවකයන්ගේ මූල්‍ය හා මූල්‍ය නොවන පහසුකම් වැඩි කිරීම
පුහුණු හා සංවර්ධන අරමුදල ක්‍රියාත්මක කිරීම සහ ඉන් පහසුකම් සැපයීම.

සෞඛ්‍ය හා ආරක්ෂණ පියවර දියුණු කිරීම
මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණාවරණයක් උපයෝජනය කිරීම.

විශිෂ්ට ශිෂ්‍ය-කේන්ද්‍රීය පරිපාලන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම
මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචි කිරීමේ ක්‍රමය සහ මුදල් ගෙවීමේ (payment gateway) පද්ධතිය මෙන්ම විද්‍යුත් ප්‍රතිචාර (e-response) පද්ධතිය දියත් කිරීම.

විශිෂ්ට කාර්යාල පරිපාලන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම
ස්ථාවර වත්කම් ලේඛනය පරිගණකගත කිරීම, ඒකක භාණ්ඩ ලේඛන සම්පූර්ණ කිරීම, සියලු අංශ සඳහා රැකියා පිරිවිතර සම්පූර්ණ කිරීම නිත්‍යගත කළ තාක්ෂණික ඇගයීම් කමිටු සහ සෘජු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සහ ක්‍රියා පටිපාටි සම්පූර්ණ කිරීම.

අධ්‍යයන ආයතනයක් ලෙස මානව සම්පත් අභිවර්ධන ආයතනය ඉහත කර්තව්‍යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක අනුගමනය කිරීමට පියවර ගෙන ඇත.

ඉලක්ක04	සියල්ලන්මට පුළුල් සාධාරණ, සමාන මෙන්ම ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සියලු දෙනාට යාවජීව ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
ඉලක්ක 08	සියල්ලන්මට පුළුල් සහ තිරසර වූ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ යහපත් රාජකාරී ප්‍රවර්ධනය කිරීම.
ඉලක්ක 09	ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩ නැගීම, පුළුල් හා තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම.
ඉලක්ක 11	නගර හා ජනාවාස පූළුල්ව ආරක්ෂිත, ඔරොත්තු දෙන තිරසාර බවට පත් කිරීම.
ඉලක්ක 16	තිරසාර සංවර්ධනය සඳහා සාමය සහ පුළුල් වූ සමාජ ප්‍රවර්ධනය, සෑම දෙනාටම යුක්ති සඳහා ප්‍රවේශ වීම සහ සෑම තලයකම ඵලදායී, වගවීම සහ පුළුල් ආයතන ගොඩ නැගීම.
ඉලක්ක 17	ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය පූනර්ජීවනය කිරීම.

2020 වර්ෂයේදී ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට පියවර ගෙන තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වා ඇත. එය 2020 ජනවාරි මස 23 වන දින ආයතන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. එහි ආරාධිත දේශනය මලයාසියාවේ මලයා විශ්වවිද්‍යාල අධ්‍යාපන පීඨයේ මහාචාර්ය විශාලච්චි බාලකෘෂ්ණන් මැතිණිය විසින් සාර්ථකව පවත්වන ලදී.

6 සමාලෝචනය
සමස්තයක් ලෙස ආයතනයේ සංයුක්ත සැලැස්මෙහි ඇති ඉලක්කයන් ගුණාත්මක අධ්‍යාපනයක් මගින් ශ්‍රී ලංකාවේ “දැනුම්-ආර්ථිකය” සඳහා බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක් දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස දැනුම්-සේවා-කාණ්ඩ උත්පාදනය කිරීම පදනම් කොට ගෙන ඇත. තිරසර සංවර්ධන ඉලක්කයන්හි ප්‍රධාන ඉලක්කයක් වන සැමට ගුණාත්වයෙන් යුත් අධ්‍යාපනයක් ලබා දීමේ වගකීම ඉතාමත් මැනෙවින් ආයතන සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම තුළින් ක්‍රමික වර්ධනයෙන් යුතුව ඉදිරියට ගෙන යාමට හැකි සියලුම ක්‍රියාමාර්ගයන් ගැනීමට ආයතනය යුහුසුළුව කටයුතු කරමින් සිටී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } HED/B/IHRA/2020/FA/02 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 අප්‍රේල් 29 දින

අධ්‍යක්ෂ,

මානව සම්පත් අභිවර්ධන ආයතනය.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

SAB
FYMA

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :-
01. ලේකම්- අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම්- මුදල් අමාත්‍යාංශය
03. සභාපති- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
04. උපකුලපති- කොළඹ විශ්වවිද්‍යාලය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/B/IHRA/2020/FA/02 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 අප්‍රේල් 29 දින

අධ්‍යක්ෂ,

මානව සම්පත් අභිවර්ධන ආයතනය.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර , ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් කර ඇති නමුත් දැනටමත් භාවිතා වෙමින් පවතින එකතුව රු.1,261,285 ක් වූ මෘදුකාංග දෙකක ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව නැවත සංශෝධනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු දේපල, පිරියත හා උපකරණ වල වර්ෂයේ ක්ෂය හා ශුද්ධ අගය පිළිවෙලින් රු. 775,847 ක් හා රු. 1,211,405 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2020 වර්ෂය සඳහා ක්‍රමක්ෂය ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණු රු.16,362,827 ක් තුළ කාර්යාල උපකරණ ක්‍රමක්ෂය වන රු.4,453,544 ක වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් එම ප්‍රමාණයෙන් අධිගණනය හා ඌනගණනය වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රදානයක් ලෙස ලැබුණු රු. 3,800,000 ක් වූ වාහනයේ වටිනාකම ප්‍රදානයක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව ප්‍රත්‍යාගණන ලාභයක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වූණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව

ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ)	2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය	අධ්‍යක්ෂවරයාගේ නිල රථය සඳහා අනුමත මාසික ඉන්ධන සීමාව වූ ලීටර 150 ඉක්මවා 2020 වර්ෂය තුළ ඉන්ධන ලීටර 691 ක් සඳහා එකතුව රු.113,316 ක් වැඩිපුර වැයකර තිබුණි.

(ආ) 2016 මාර්තු 31 දිනැති අංක 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2021 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2020 අප්‍රේල් 21 දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. වෙනත් නිරීක්ෂණ

අස්පෘශ්‍ය වත්කම් යටතේ රු.980,000 ක් පිරිවැය වූ Geo Informatics System ලෙස 2018 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් මෘදුකාංගයක් සමාලෝචිත වර්ෂය දක්වා ගිණුම්ගතව පැවතියද අදාළ මෘදුකාංගය 2018 වර්ෂයේ සිටම භාවිතයෙන් තොරව පවතින බවට නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව						
මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම				**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**	**ඉදිරිපත් කරන පිළිතුරු**	**2020වන විට ගන්නා ලද ක්‍රියා මාර්ග වර්තමාන තත්ත්වය සහ සංවර්ධනය**
1.	1.2	(අ)	මූල්‍ය ප්‍රකාශන **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**	සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් කර ඇති නමුත් දැනටමත් භාවිත වෙමින් පවතින එකතුව රු. 1,261,285ක් වූ මෘදුකාංග දෙකක වලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සංශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි මෙම ගිණුම් වර්ෂය තුළ දී නියමිත සමාලෝචන කටයුතු සිදු කොට ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	2021 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර (Re-valuation) ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.
		(ආ)		ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු දේපල පිරියත හා උපකරණවල වර්ෂයේ ක්ෂය හා ශුද්ධ අගය පිළිවෙලින් රු. 775,847ක් හා රු. 1,211,405ක් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කෙරේ.	2021 වර්ෂයේදී නිවැරදි කර ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව						
විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු				**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**	**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**	**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**
		(ඇ)		2020 වර්ෂය සඳහා ක්‍රමසෂය ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණු රු. 16,362,827ක් තුළ කාර්යාල උපකරණ ක්‍රමසෂය වන රු. 4,453,544ක වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය හා ප්‍රාග්ධන ප්‍රදාන ලිළිවෙලින් එම ප්‍රමාණයෙන් අධිගණනය හා ඌනගනනය වී තිබුණි.	ගිණුම් වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු සිදු කෙරේ.	2021 වර්ෂයේදී නිවැරදි කර ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.
		(ඇ)		සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රදානයක් ලෙස ලැබුණු රු. 3,800,000ක් වූ වාහනයේ වටිනාකම ප්‍රදානයක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව ප්‍රත්‍යාගණන ලාභයක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.	විගණන නිරීක්ෂණයේ කරුණු නිවැරදිය. වාහනය අත්පත් කර ගැනීමට අදාළ නිවැරදි ගිණුම්ගත කිරීම් 2021 වර්ෂයේ ගිණුම් තුළ සිදු කෙරේ.	2021 වර්ෂයේදී නිවැරදි කර ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව						
විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු				**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**	**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**	**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**
2.	2.2.2	(අ)	**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** **නිතිරීති/ විධානයට යොමුව** 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	අධ්‍යක්ෂවරයාගේ නිල රථය සඳහා අනුමත මාසික ඉන්ධන සීමා වූ ලීටර් 150 ඉක්මවා 2020 වර්ෂය තුළ ඉන්ධන ලීටර් 691ක් සඳහා එකතුව රු. 113,316ක් වැඩිපුර වැය කර තිබුණි.	අධ්‍යක්ෂතුමාගේ රාජකාරී කටයුතු අධික වීම හා වැඩමුළුවලට සහභාගි වීම සිදු වී ඇති නිසා අදාල ගමන් වාර සිදු කර ඇති බැවින් මෙම දෝෂය සිදු වී ඇත. මේ පිළිබඳ වැඩිදුර විස්තරයක් ඉතා ඉක්මනින් ලබා දීමට කටයුතු කෙරේ.	අධ්‍යක්ෂතුමාගේ රාජකාරී කටයුතු අධික වීම හා වැඩමුළුවලට සහභාගි වීම සිදු වී ඇති නිසා අදාල ගමන් වාර සිදු කර ඇති බැවින් මෙම දෝෂය සිදු වී ඇත. මේ පිළිබඳ වැඩිදුර විස්තරයක් ඉතා ඉක්මනින් ලබා දීමට කටයුතු කෙරේ.
		(ආ)	2016 මාර්තු 31 දිනැති අංක 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2021 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2020 අප්‍රේල් 21 දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2020 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2021 පෙබරවාරි 15 දින පැවති 425වන ශාස්ත්‍රීය කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර එය පිළිගෙන ඇත. 2021.02.15 දිනෙන් පසුව ආයතනයේ නියමාවලිය (Ordinance) වෙනස් වීම හේතුවෙන් මේවන තෙක් කළමනාකරණ මණ්ඩල (Board of	විගණකාධිපතිවරයා වෙත යැවීමට කටයුතු කර ඇත.

					Management) රැස්වීමක් පැවැත්වීමට හැකියාවක් ලැබී නැත. 425වන කමිටු රැස්වීම් සටහන් (minutes)නව කළමනාකරණ මණ්ඩල රැස්වීදි අනුමත වීමෙන් අනතුරුන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	
කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව						
විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු				**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**	**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**	**විගණකාධිපති විසින් පෙන්වා ඇති කරුණු**
3.			වෙනත් නිරීක්ෂණ	අස්පෘශ්‍ය වත්කම් යටතේ රු. 980,000ක් පිරිවැය වූ Geo Informatics System ලෙස 2018 ජනවාරි01 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර ඵුවසන් මෘදුකාංගයක් සමාලෝචිත වර්ෂය දක්වා ගිණුම්ගතව පැවතිය ද අදාල මෘදුකාංග 2018 වර්ෂයේ සිටම භාවිතයෙන් තොරව පවතින බවට නිරීක්ෂණය විය.	මෙම මෘදුකාංගය විශේෂික වූ පාඨමාලාවක් සඳහා මිල දී ගත මෘදුකාංගයක් වන අතර, අදාල පෘඨමාලාව මේවන විට නෙපවත්වන අතර, වාර්ෂික අලුත් කිරීම් ද නොකරන හෙයින් භාවිත තිරීම ද සිදු කරනු නොලැබේ.	මෙම මෘදුකාංගය භූකොරතුරු විද්‍යාපති පාඨමාලාව වෙනුවෙන් මිල දී ගෙන ඇත. කෙසේ වෙතත්, 2016 වර්ෂයේ සිට ආයතනය තුළ උක්ත පාඨමාලාව සම්බන්ධිකරණය වීමක් සිදු වී නොවැති හෙයින් විද්‍යාර්ථින් බඳවා ගෙන නොමැත. මෙයට හේතු වී ඇත්තේ විෂය විශේෂඥයින් නොමැති වීමයි. එනිසා එම